Unit 5

Advanced Level

# BIOLOGY

## සත්ව ආකාරය සහ ක්‍රියාකාරීත්වය

1. MCQ
2. Structural Essay
3. Essay

gico

Nissanka Weerasekara
[B.Sc, Dip in Ed, M.Sc (Bio)]

Scanned with CamScanner

01. ආශ්වාසයේදී පහත සඳහන් ඒවායින් කුමක් සිදු වේ ද?
(1) බාහිර අන්තර්පර්ශුක පේශි ඉහිල් වීම.
(2) මහා ප්‍රාචීරය ඉහිල් වීම.
(3) උරතලය ඉදිරියට චලනය වීම
(4) ප්ලූරා කුහරයේ පීඩනය වැඩි වීම.
(5) ගර්ත තුළට අන්තර්සෙලීය තරලය ගලා ඒම

02. සත්ත්වයින්ගේ රුධිර සංසරණ පද්ධති පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නෙමටෝඩාවන්ට සහ එකයිනොඩර්මේටාවන්ට රුධිර සංසරණ පද්ධති නොමැත.
(2) කෘමීන්ට සහ පටි පණුවන්ට විවෘත රුධිර සංසරණ පද්ධති ඇත.
(3) ඇනලිඩාවන්ට සහ මත්ස්‍යයන්ට සංවෘත රුධිර සංසරණ පද්ධති ඇත.
(4) ක්ලෝරොක්රුවෝරින් ක්‍රස්ටේශියාවන්ගේ ශ්වසන වර්ණකයක් ලෙස ක්‍රියා කරයි.
(5) කර්ණික - කෝෂික (AV) ගැටය මිනිස් හෘදයේ ගතිකරය ලෙස ක්‍රියා කරයි.

03. මිනිස් මොළය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) සිව්බිඩි දේහ ව්‍යුත්පන්න වී ඇත්තේ කලල අපර මස්තිෂ්කයෙනි.
(2) වැරෝලි සේතුව, හුස්ම ගැනීමේ ශීඝ්‍රතාව යාමනය කරයි.
(3) පූර්ව මස්තිෂ්කය, අක්ෂි පේශිවල ප්‍රතීක චලන පාලනය කරයි.
(4) අනුමස්තිෂ්කය, කිවිසීම සහ කැස්ස පාලනය කරයි.
(5) මස්තිෂ්කය, වේදනා සංවේදක සංජානනය සඳහා සහභාගි වේ.

04. නියුරෝනවල කායික විද්‍යාව පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අක්‍රිය පටල විභවය පවත්වා ගැනීම සඳහා සෝඩියම් - පොටැසියම් පොම්පය අත්‍යවශ්‍ය ය.
(2) අක්‍රිය පටල විභවය -70 mV පමණ වේ.
(3) ක්‍රියා විභවයක් පවතින කාලය 2 ms පමණ වේ.
(4) මයලිනිභූත අක්සනයක ක්‍රියා විභවය ඇති වන්නේ රැන්වියර් ගැටවල පමණි.
(5) ක්‍රියා විභවයේ ප්‍රතිධ්‍රැවණ කලාවේදී $K^+$ ඇතුළට ගැලීම සිදු වේ.

05. මිනිස් කැල්සිටෝනින් හෝර්මෝනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) තයිරොයිඩ ග්‍රන්ථියේ ස්‍යුතිකා සෙල මඟින් එය ස්‍රාවය කරනු ලබයි.
(2) එය රුධිර කැල්සියම් මට්ටම අඩු කරයි.
(3) එය අස්ථි තුළ කැල්සියම් ගබඩා කිරීම වැඩි කරයි.
(4) එය වෘක්කාණුව තුළදී කැල්සියම් ප්‍රතිශෝෂණය කිරීම නිශේධනය කරයි.
(5) එහි බලපෑම් පැරාතයිරොයිඩ හෝර්මෝනයේ බලපෑම්වලට ප්‍රතිවිරුද්ධ ය.

06. මිනිස් හෝර්මෝන පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කොලිසිස්ටොකයිනින්, අග්න්‍යාශය සහ අක්මාව යන දෙක ම මත ක්‍රියා කරයි.
(2) B වසා සෛලවල විකසනය කෙරෙහි තයිමස බලපායි.
(3) ග්ලූකගන් ස්‍රාවය කරනු ලබන්නේ ලැන්ගර්හැන් දිපිකාවල $\beta$ සෛල මඟිනි
(4) වෘක්කාණුවේදී $Na^+$ සහ $K^+$ ප්‍රතිශෝෂණය වීම ඇල්ඩොස්ටෙරොන් මගින් උත්තේජනය වේ.
(5) වෘක්ක නාලිකාවල විදූර සංවලිත නාලිකාව සහ සංග්‍රාහක ප්‍රණාලය මත ADH ක්‍රියා කරයි.

07. බහිස්ස්‍රාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) සමස්ථිතිය පවත්වා ගැනීම සඳහා බහිස්ස්‍රාවය අත්‍යවශ්‍ය ය.
(2) බහිස්‍රාවය යනු දේහයෙන් නයිට්‍රජනීය අපද්‍රව්‍ය ඉවත් කිරීම ය.
(3) මිනිසුන්ගේ පිත්ත වර්ණක, වෘක්ක සහ ආහාර මාර්ගය මගින් බහිස්ස්‍රාවය කෙරේ.
(4) වෘක්කිකා, ඇනලීඩාවන්ගේ සහ මොලස්කාවන්ගේ බහිස්ස්‍රාවී ව්‍යුහ යි.
(5) ක්ෂීරපායින්ගේ නයිට්‍රජනීය බහිස්ස්‍රාවයේ ප්‍රථම ඵලය ඇමෝනියා ය.



Scanned with CamScanner

08. මිනිස් කශේරුකා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අක්ෂ කශේරුකාවේ දේහයේ උත්තර ප්‍රසරයක් ඇත.
(2) ඇට්ලස් කශේරුකාවේ ආකෘතික කණ්ටක ප්‍රසරයක් ඇත.
(3) ත්‍රිකාස්ථිය තැනී ඇත්තේ කශේරුකා හයකිනි.
(4) උරස් කශේරුකාවේ ද්විභින්න කණ්ටක ප්‍රසරයක් ඇත.
(5) විශාලම කශේරුකා ඡිද්‍රය ඇත්තේ කටි කශේරුකාවල ය.

09. ඔසප් චක්‍රය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) චක්‍රයේදී ප්‍රොජෙස්ටරෝන් මට්ටම උච්ච වනුයේ ඔසප් වීමට දින 2 - 3 කට පෙරය.
(2) එය ආරම්භ කෙරෙනුයේ පිටියුටරි හෝර්මෝන මගිනි.
(3) චක්‍රයේදී උච්ච FSH මට්ටම, උච්ච LH මට්ටමට වඩා වැඩි ය.
(4) ප්‍රගුණන අවධිය සහ ස්‍රාවී අවධිය එකම දිගින් යුක්ත ය.
(5) ඊස්ට්‍රජන් සහ ප්‍රොජෙස්ටරෝන් මට්ටම්වල අනවරත අඩුවීම නිසා ඔසප් වීම සිදු වේ.

10. මානව පැලෝපීය නාලය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) එය විදූර කෙළවරේ පුනීලයක් වැනි විවරයක් සහිත ප්‍රණාලයකි.
(2) එහි කුහරය පක්ෂ්මධර අපිච්ඡදයකින් ආස්තරණය වේ.
(3) එය ඩිම්බය ඩිම්බකෝෂයේ සිට ගර්භාෂය දක්වා ප්‍රවාලනය කරයි.
(4) එහි ස්‍රාවයන් ඩිම්බය සහ ශුක්‍රාණු යන දෙකම පෝෂණය කරයි.
(5) සංසේචනය සාමාන්‍යයෙන් සිදු වන්නේ එහි පහළ $\frac{1}{3}$ ප්‍රදේශයේදී ය.

11. මිනිස් අපිවෘෂණය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එය අතිශයින් දඟර ගැසුනු නාලයකි. (2) එය වෘෂණයට සහ ශුක්‍ර නාලයට සම්බන්ධ වේ.
(3) එය විසර්ජනයට පෙර ශුක්‍රාණු ගබඩා කරයි. (4) එය තුළදී ශුක්‍රාණු සංසේචන හැකියාව ලබා ගනී.
(5) ශුක්‍රාණුවල අධිසක්‍රියකරණය සිදු වන්නේ එය තුළදී ය.

12. මිනිස් භ්‍රෑණයේ විකසනය සහ ළදරුවාගේ වර්ධනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ගර්භණීභාවයේ තුන්වැනි මාසය අවසානය වන විට භ්‍රෑණයේ හෘත් ස්පන්දනය හඳුනා ගත හැකි ය.
(2) ගර්භණීභාවයේ තුන්වැනි මාසය අවසානය වන විට භ්‍රෑණයේ දේහය සියුම් රෝමවලින් වැසී ඇත.
(3) ළදරුවෙක් විවිධ ස්වරවලින් හඬ නැගීමේ හැකියාව ලබා ගන්නේ සාමාන්‍යයෙන් උපතින් මාස දෙකකට පසුවය.
(4) උපතින් මාස තුනක් ගත වන විට ළදරුවාට තනිව හිඳ ගැනීමට හැකි ය.
(5) මාස 10ක් වයස් වන විට ළදරුවාට පවුලේ අනෙක් සාමාජිකයන් ගන්නා ආහාර ලබා දිය යුතු ය.

13. අස්ථිමය සැකිල්ලක් නොමැති සත්ත්වයින් අන්තර්ගත වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේ ද?/ කාණ්ඩවල ද?
(A) කෝඩේටා (B) ආවේස් (C) නෙමටෝඩා (D) ආත්‍රොපෝඩා (E) මැමේලියා

14. නිරෝගී වැඩිහිටි සාමාන්‍ය පුද්ගලයකුගේ රුධිර ග්ලූකෝස් මට්ටම කෙරෙහි බලපාන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?/ කුමන ඒවාද?
(A) තයිරොයිඩ ග්‍රන්ථිය (B) හයිපොතැලමස (C) පැරාතයිරොයිඩ ග්‍රන්ථිය
(D) ග්ලූකගන් (E) ඇල්ඩොස්ටෙරෝන්

15. නිරෝගී වැඩිහිටි සාමාන්‍ය පුද්ගලයකුගේ මුත්‍ර සාම්පලයක අඩංගු විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක් ද?/කුමන ඒවාද?
(A) $H^+$ (B) ඇමයිනෝ අම්ල (C) ක්‍රියටිනීන් (D) $K^+$ (E) සුදු රුධිරාණු



Scanned with CamScanner

16. හෘත් පේශී පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?
(A) ඒවා අන්තරස්ථාපිත මඬල දරයි. (B) ඒවා දිග, සිලින්ඩරාකාර, ශාඛනය වූ සෛල දරයි.
(C) ඒවායේ හිදැස් සන්ධි ඇත. (D) ඒවා පේශිජන්‍ය ය.
(E) එක් එක් පේශී සෛලය තනි සාකොමියරයකින් සමන්විත ය.

17. සත්ත්ව සැකිලි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/ කුමන ඒවා ද?
(A) ඇතුළු සැකිල්ල සහ පිටසැකිල්ල යන දෙක ම ආරක්ෂාව සපයයි.
(B) රේඩියෝලේරියාවන් ඇතුළු සැකිලි දරයි. (C) සියලු සැකිලි කැල්සියම් සංචිත දරයි.
(D) ද්‍රවස්ථිති සැකිල්ල ඇනලීඩාවන්ගේ සහ නෙමටෝඩාවන්ගේ දැකිය හැකි ය.
(E) මොලස්කාවන්ට ඇත්තේ පිටසැකිලි පමණි.

18. මිනිසාගේ ශ්වසන පද්ධතිය පිළබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) බාහිර අන්තර්පර්ශුක පේශිවල සංකෝචනය නිසා ආශ්වාසය සිදු වේ.
(2) ශ්වාසනාල කුහරය ස්තම්භික අපිච්ඡදයෙන් ආස්තරණය වේ.
(3) දකුණු පෙනහැල්ල ඛණ්ඩිකා දෙකකින් සමන්විත වේ.
(4) පෙනහැලි තුළදී ශ්වසන වායු හුවමාරුව සඳහා ශක්තිය අවශ්‍ය වේ.
(5) ස්වරාලය දෙවැනි සහ තුන්වැනි ග්‍රෛවී කශේරුකා එකම මට්ටමේ පිහිටයි.

19. මිනිස් රුධිරය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එය විශේෂිත සම්බන්ධක පටකයකි.
(2) පරිණත රක්තාණුවක්, න්‍යෂ්ටිය සහ මයිටොකොන්ඩ්‍රියා යන දෙකම නොදරයි.
(3) නියුට්‍රොෆිල සහ මොනොසයිට භක්ෂෛසෙලකතාව දක්වන සුදු රුධිරාණු වේ.
(4) කාබන් ඩයොක්සයිඩ් වලින් වැඩිම ප්‍රමාණයක් පරිවහනය කෙරෙනුයේ හිමොග්ලොබින් සමඟ සම්බන්ධ වීමෙනි. (5) එය දේහ උෂ්ණත්වය යාමනය කිරීමට උපකාරී වේ.

20. මිනිස් හෘදයේ සන්නායක පද්ධතියේ කොටසක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) හෘද රජ්ජු (2) කර්ණික කෝෂික (AV) ගැටය (3) හිස් කළඹ
(4) සයිනෝ - හෘත්කර්ණික (SA) ගැටය (5) පර්කින්ජේ තන්තු

21. මානව වර්ධක හෝමෝනය පිළිබඳ වැරදි ප්‍රකාශය තොරන්න.
(1) එය සංස්ලේෂණය කර නිදහස් කරනු ලබන්නේ පූර්ව පිටියුටරිය මඟිනි.
(2) හයිපොතැලමස මඟින් එය නිදහස් කිරීම වැඩි කිරීමට හෝ අඩු කිරීමට හෝ පුළුවන.
(3) එය රුධිර ග්ලූකෝස් මට්ටම වැඩි කරයි. (4) එය මේද සංස්ලේෂණය වැඩිකරයි.
(5) එය අක්මාවේ පරිවෘත්තිය යාමනය කරයි.

22. මිනිස් මොළය පිළිබඳව වැරදි ප්‍රකාශය තෝරන්න
(1) කථනය හා සම්බන්ධ ක්‍රියාකාරී ප්‍රදේශය පිහිටන්නේ ලලාට ඛණ්ඩිකාවේ ය.
(2) කැලෝස දේහය මඟින් මස්තිෂ්කයේ අර්ධගෝල දෙක සම්බන්ධ වේ.
(3) සංතුලනය හා සමතුලිතතාව පවත්වා ගැනීමේ ලා අනුමස්තිෂ්කය වැදගත් කාර්යයක් ඉටු කරයි.
(4) සංවේදක තොරතුරු සමෝධානය කිරීමේදී තැලමස දායක වේ.
(5) කැස්ස සඳහා ප්‍රතීක මධ්‍යස්ථානය පිහිටන්නේ වැරෝලි සේතුවේය.

23. මිනිස් චාලක නියුරෝනයක ක්‍රියා විභවයක් පිළිබඳව වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එක් ක්‍රියා විභවයකට වහාම පසුව, දෙවැනි ක්‍රියා විභවයක් ජනනය කිරීමට නොහැකිය.
(2) එය ජනනය වනුයේ රන්වියර් ගැටවල දී පමණි.
(3) එහි විධ්‍රැවන කලාවට වහාම පසුව, උපර්ධ්‍රැවණ කලාව ඇති වේ.
(4) එහි කාලසීමාව මිලිතත්පර දෙකක් පමණ වේ.
(5) එය ජනනය කිරීම සඳහා දේහලීය උත්තේජනය අත්‍යවශ්‍ය වේ.



Scanned with CamScanner

24. බහිස්‍රාවය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න
(1) බහිස්‍රාවය සිදු නොවුවහොත් රුධිර pH අගය වෙනස් විය හැකිය
(2) මලපහ කිරීම බහිස්‍රාවී ආකාරයකි.
(3) පිත්ත වර්ණක මිනිසාගේ බහිස්‍රාවී ඵලයක් වේ.
(4) නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය ලෙස යූරික් අම්ලය නිපද වන විට කාබන් හානිය උපරිම වේ.
(5) බහිස්‍රාවී ඵලයක් ලෙස ඇමෝනියා නිපදවීමට ශක්තිය අවශ්‍ය නොවේ.

25. සිනිඳු පේශි පිළිබඳ වැරදි වනුයේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කුමක් ද?
(1) ඇදීමෙන් පසු මුල් දිගට පැමිණීමේ හැකියාවක් ඒවා පෙන්නුම් කරයි.
(2) ඇඩ්රිනලින් සමහර සිනිඳු පේශි සංකෝචනය කරන අතර අනිත් ඒවා ඉහිල් කරයි.
(3) සමහර ඒවා රිද්මාකාර සංකෝචන දක්වයි.
(4) ඒවා ඉක්මනින් විඩාවට පත් වේ.
(5) ඒවා ස්වයංසාධක ස්නායු පද්ධතිය මගින් ස්නායුත වේ.

26. කංකාල පේශිය පිළිබඳ වැරදි වනුයේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කුමක් ද?
(1) එහි සංකෝචනය ආරම්භ කිරීම සඳහා සාමාන්‍යයෙන් ඇසිටයිල්කෝලීන් අවශ්‍ය ය.
(2) එය සංකෝචනය වීමේ දී A පටිවල සහ I පටිවල දිග නියත ව පවතී.
(3) එය සංකෝචනය වීමේදී බල පහර ශ්‍රේණියක් ඇති වේ.
(4) ATP සහ $Ca^{2+}$ රහිත ව එයට සංකෝචනය වීමට නොහැකි ය.
(5) එය සංකෝචනය වීමේ දී Z රේඛා දෙකක් අතර දුර කෙටි වේ.

27. මිනිස් අංසඵලකය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එය පැතලි ත්‍රිකෝණ හැඩැති අස්ථියකි.
(2) එය අපර පෘෂ්ඨය රළු වේ.
(3) එහි අංසකූට ප්‍රසරය අක්ෂකාස්ථිය සමග සන්ධානය වේ.
(4) එහි ග්ලෙනොයිඩ කුහරය මධ්‍ය දාරයේ පිහිටයි.
(5) තුණ්ඩාකාර ප්‍රසරය, එහි ඉහළ දාරයෙන් පැන නැඟුණු ප්‍රසරයකි.

28. මිනිසාගේ පහළ ගාත්‍රය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඌර්වස්ථිය යනු දේහයේ මධ්‍ය රේඛාවට සමාන්තරව පිහිටන දිගු අස්ථියකි.
(2) පහළ ගාත්‍රයේ දෙවැනි දිගු ම අස්ථිය ජංඝාස්ථිය ය.
(3) එය අස්ථි 30කින් සමන්විත වේ.
(4) අනුජංඝාස්ථිය දණිස් සන්ධියේ කොටසක් නොවේ.
(5) පාදයේ අන්වායාම සහ හරස් වක්‍ර යන දෙකම ඇත.

29. පුරුෂයන්ගේ ප්‍රජනනය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ටෙස්ටොස්ටෙරොන් ප්‍රජනක පද්ධතියේ සියලු කොටස් මත ක්‍රියා කරයි.
(2) ශුක්‍ර ආශයිකා ස්‍රාවයෙහි ග්ලූකෝස් සහ විටමින් C ඇත.
(3) ශුක්‍රාණු අධිසක්‍රිය වීම ස්ත්‍රී ප්‍රජනක මාර්ගය තුළ දී සිදු වේ.
(4) ශුක්‍රාණු ජනනය සඳහා දින 72ක් පමණ ගත වේ.
(5) ස'ටොලි සෛලය අන්තරාසර්ග ව්‍යුහයක් ලෙස ක්‍රියා කරයි.

30. පහත දැක්වෙන ප්‍රජනක ව්‍යුහ අතුරෙන් යුගලමය නොවන්නේ කුමක් ද?
(1) ශුක්‍ර ආශයිකාව
(2) කූපර් ග්‍රන්ථිය
(3) විසර්ජක ප්‍රණාලය
(4) පුරුෂස්ථ ග්‍රන්ථිය
(5) ශුක්‍ර නාලය

31. නියුරෝනයක සෝඩියම් - පොටෑසියම් පොම්පය පිළිබඳ නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න.
(A) $Na^+$ හා $K^+$ පොම්ප කිරීම එකිනෙක මත රඳා පවතී.
(B) එය නියුරිලෙමාවේ පිහිටයි
(C) ATP ඌනතාව එහි ක්‍රියාකාරීත්වයට බාධා කළ හැකිය.
(D) අක්‍රිය පටල විභවය පවත්වා ගැනීමට එය අත්‍යවශ්‍යය.
(E) එය බහිස්සෛලීය තරලයේ සිට නියුරෝනය තුළට $Na^+$ පොම්ප කරයි.



Scanned with CamScanner

32. නිරෝගී පරිනත පුද්ගලයෙක් නිපදවන මුත්‍ර ප්‍රමාණය රඳා පවතිනුයේ පහත සඳහන් කුමක් / කුමන ඒවා මතද?

(A) රුධිරයේ ADH මට්ටම (B) හයිපොතැලමසේ ක්‍රියාකාරිත්වය (D) කායික ක්‍රියාකාරිත්වය
(C) වෘක්කාණු වල අවිදූර සංවලිත නාලිකා වල ක්‍රියාකාරිත්වයයි. (E) රුධිර පරිමාව

33. මානව කලලබන්ධය පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.

(A) එය පතනශීලී අලින්ථකෝරියම් ආකාරයේ කලලබන්ධයකි.
(B) ගර්භණීභාවයේ මුල් අවස්ථාවලදී එය hCG සහ ප්‍රොජෙස්ටෙරොන් නිපදවයි.
(C) භ්‍රෑණ සහ මාතෘ රුධිරය මිශ්‍ර වීම එය වළක්වයි.
(D) එයට ප්‍රොස්ටග්ලැන්ඩින් නිපදවීමට පුළුවන
(E) එය මවගේ සිට භ්‍රෑණයටත් භ්‍රෑණයේ සිට මවටත් ජලය ගමන් කිරීමට ඉඩ සලසයි.

34. මානව ගර්භාෂය පිළිබඳ වැරදි ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.

(A) එය කුහරමය, පේශිමය, පෙයාර් හැඩැති අවයවයකි.
(B) එහි සංකෝචන හැකියාව ප්‍රොජෙස්ටරොන් මගින් නිශේධනය වේ.
(C) සංසේචනය සාමාන්‍යයෙන් සිදු වන්නේ එය තුළදිය.
(D) එහි ඇතුළු ස්තරය ඝනාකාර අපිච්ඡදයකින් සහ ශ්ලේෂ්මල ස්‍රාවී නාලාකාර ග්‍රන්ථිවලින් සෑදී ඇත.
(E) ගර්භණීභාවය අවසානයේ දී එහි සංකෝචන ඊස්ට්‍රජන් මගින් උත්තේජනය වේ.

35. උපාගම ප්‍රථමයෙන් ම විකසනය වූයේ

(1) නිඩාරියාවන්ගේ ය. (2) පැතලි පණුවන්ගේ ය. (3) ඇනලීඩාවන්ගේ ය.
(4) එකයිනොඩර්මේටාවන්ගේ ය. (5) ආත්‍රොපෝඩාවන්ගේ ය.

36. ප්‍රත්‍යනුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම නිසා සිදුවනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) පිටවන මුත්‍ර ප්‍රමාණය වැඩි වීම (2) දහදිය දැමීම අඩු වීම
(3) රෝම උද්ගාමක පේශී ඉහිල් වීම. (4) හමේ ධමනිකා විස්තාරණය වීම
(5) ගුද වක්‍රපිධානය සංකෝචනය වීම

37. මිනිසාගේ අන්තරාසර්ග ග්‍රන්ථි කීපයක් සහ දේහය තුළ ඒවා පිහිටන ස්ථාන පහත දැක්වේ. එම සංකලන අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) හයිපොතැලමස - මධ්‍ය මස්තිෂ්කයේ පූර්ව ප්‍රදේශයේ
(2) පිටියුටරිය - කැලෝස දේහයට වහාම පහළින් (3) තයිරොයිඩය - ශ්වසනාලයේ මධ්‍ය ප්‍රදේශයේ
(4) තයිමස - හෘදයට වහාම ඉහළින් (5) පැරාතයිරොයිඩ - තයිරොයිඩයේ පූර්ව පාර්ශ්වයේ

38. මිනිස් මොළයේ වැරෝලි සේතුව

(1) පූර්ව මස්තිෂ්කය සහ අපර මස්තිෂ්කය අතර සේතුවක් තනයි.
(2) මධ්‍ය මස්තිෂ්කයේ පිහිටා ඇත. (3) හිසේ ප්‍රතීක චලන පාලනය කරයි
(4) රුධිර පීඩනය පාලනය කරයි. (5) පෙනහැලිවල වාතාශ්‍රය යාමනය කරයි.

39. මිනිස් ඇසේ,

(1) ප්‍රතීක චලන පාලනය කෙරෙනුයේ මධ්‍ය මස්තිෂ්කය මගිනි.
(2) ශ්වේතසන ස්තරයේ ඇතුළත පෘෂ්ඨයේ 3/4ක් පමණ ආස්තරණය වනුයේ රුධිර ග්‍රාහයෙනි.
(3) ප්‍රතියෝජක දේහය යනු දෘෂ්ටිවිතානයේ පූර්ව දික්වීමකි.
(4) කාචය සහ ස්වච්ඡය අතර කාච රසය පිහිටයි.
(5) යෂ්ටි සංඛ්‍යාව, කේතු සංඛ්‍යාව මෙන් දස ගුණයක් පමණ වේ.

45. මිනිසාගේ ශුක්‍රාණු, ඩිම්බයක් සංසේචනය කිරීමේ හැකියාව ලබා ගනුයේ පහත සඳහන් කුමන ව්‍යූහයතුළදීද?

(1) ශුක්‍ර ආශයිකාව (2) යෝනි මාර්ගය (3) මුත්‍ර මාර්ගය (4) ශුක්‍ර නාලය (5) අපිවෘෂණය



Scanned with CamScanner

40. සත්ත්වයින්ගේ බහිස්‍රාවී ව්‍යුහ පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) කැස්බෑවන්ගේ ලවණ ග්‍රන්ථි පිහිටනුයේ ජම්බාලිය ආසන්නයේ ය.
(2) මිනිසාගේ ස්වේද ග්‍රන්ථි අපිචර්මයේ ගැඹුරු ස්තරවල ද පිහිටයි.
(3) ක්‍රස්ටේෂියාවන්ගේ හරිත ග්‍රන්ථි අන්නස්‍රෝතයට පූර්ව ව පිහිටයි.
(4) කෘමීන්ගේ මැල්පීගිය නාලිකා විවෘත වනුයේ දේහයේ උදරීය පෘෂ්ඨයෙනි.
(5) සිළු සෛල පැතලි පණුවන් සහ නිඩාරියාවන් තුළ දැකිය හැකි ය.

41 ප්‍රශ්නය පහත දී ඇති අයන මත පදනම් වේ.
(a) $Na^+$ (b) $Cl^-$ (c) $HCO_3^-$ (d) $K^+$ (e) $H^+$

41. මිනිස් වෘක්කාණුවේ විදූර සංවලිත නාලිකාවේ දී නැවත අවශෝෂණය කෙරෙනුයේ ඉහත සඳහන් කුමන අයන ද?
(1) a සහ c පමණි. (2) a, b සහ c පමණි. (3) b සහ c පමණි.
(4) c, d සහ e පමණි. (5) a, b සහ e පමණි.

43. සත්ත්වයින්ගේ පිටසැකිල්ල පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) පිටසැකිල්ලක් දරන ප්‍රධාන සත්ත්ව කාණ්ඩය මොලස්කාවන් ය.
(2) මුහුදු ඉකිරි පිටසැකිල්ලක් දරන බැවින් අනෙක් එකයිනොඩර්මේටාවන්ගෙන් වෙනස් වේ.
(3) සමහර උරගයන්ගේ දේහය සන්ධාරණය වනුයේ පිටසැකිල්ලෙන් පමණි.
(4) ආත්‍රෝපෝඩාවන්ගේ පිටසැකිල්ල කාබෝහයිඩ්‍රේට, ප්‍රෝටීන සහ කැල්සියම් කාබනේට් දරයි.
(5) සමහර නිදැලිවාසී නෙමටෝඩාවන්ගේ දේහය පිටසැකිල්ලකින් ආවරණය වේ.

44. මිනිසාගේ දර්ශීය කශේරුකාවක,
(1) කශේරුකා දේහයෙන් හටගන්නා ප්‍රසර දෙකක් පාර්ශ්වික ව විහිදී තීර්යක් ප්‍රසර තනයි.
(2) එක් එක් තීර්යක් ප්‍රසර සන්ධාන මුහුණත බැගින් දරයි.
(3) ස්නායු මාර්ග චක්‍රයේ සන්ධාන ප්‍රසර යුගල දෙකක් පිහිටයි.
(4) එක් එක් තීර්යක් ප්‍රසරයේ කශේරු ධමනිය සඳහා ඡිද්‍රයක් බැගින් ඇත.
(5) ස්නායු මාර්ග කණ්ටකය ද්විභින්න ය.

46. සමහර ස්ත්‍රීන්ගේ ගර්භනීභාවයේ මුල් අවධියේදී දක්නට ලැබෙන ලක්ෂණයක් වනුයේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
(1) මලබද්ධය (2) මුත්‍ර පහකිරීමේ වාර ගණන අඩු වීම (3) තනපුඩු ලා පැහැයක් ගැනීම
(4) උදරය විශාල වීම (5) පියයුරුවල තදභාවය වැඩිවීම

47. විසර්ජනයෙන් පසු මිනිස් ශුක්‍රාණුවක උපරිම ආයු කාලය
(1) පැය 12 කි. (2) පැය 24 කි. (3) පැය 48 කි. (4) පැය 72 කි. (5) පැය 96 කි.

48. මානව ඩිම්බය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) හරස්කඩක එය අණ්ඩාකාර හැඩයක් ගනී. (2) බීජාන්තය ඉතා ම සුළු ප්‍රමාණයක් එහි අඩංගු ය.
(3) එය ලයිසොසෝම දරයි. (4) එහි එහි ආයු කාලය පැය 12 - 18 ක් පමණ වේ.
(5) ශුක්‍රාණුවක් නිවේධනය වූ විගස ම එය ඒකගුණ වේ.

49. මිනිස් ආමාශය
(A) උදර කුහරයේ ඉහළ දකුණු ප්‍රදේශයේ පිහිටා ඇත.
(B) අන්තරාසර්ග සහ බාහිරාසර්ග පටක දරයි.
(C) බේටයේ ඇති එන්සයිමවලට කෘත්‍යමය ලෙස සමාන එන්සයිම ස්‍රාවය කරයි.
(D) ලිපිඩ ජීරණයේ අන්ත ඵල සුළු ප්‍රමාණයක් අවශෝෂණය කරයි.
(E) pH අගය 4 - 5ක් පමණ වන තරලයක් සහිත යි.



Scanned with CamScanner

50. ජීවීන්ගේ චලන පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ කුමක් ද?/ කුමන ඒවා ද?
(A) ව්‍යාජපාද චලනය පෘෂ්ඨවංශීන් තුළ දැකිය හැකි ය.
(B) කශිකාමය චලනය සමහර දිලීරවල බීජාණුවල දැකිය හැකි ය.
(C) සමහර නෙමටෝඩාවන්ගේ බහිස්‍රාවී තරල පරිවහනය සඳහා පක්ෂ්මීය චලනය දායක වේ.
(D) පක්ෂ්මීය චලනය පැතලි පණුවන්ගේ දැකිය හැකි ය.
(E) සමහර ක්‍රස්ටේෂියාවන්ගේ රුධිර හෙබ තුළ රුධිරය සංසරණය වනුයේ පක්ෂ්මීය චලනය මඟිනි.

51. දරුවෙක් පහත දැක්වෙන විටමින ඌනතා ලක්ෂණ පෙන්වයි.
(a) විඩාව (b) රක්තහීනතාව (c) තුවාල සුව වීම ප්‍රමාද වීම
ඔහු ඌනතාවක් දක්වන විටමින වනුයේ,
1. පැන්ටොතෙනික් අම්ලය, ෆෝලික් අම්ලය සහ ඇස්කෝබික් අම්ලයයි.
2. තයමින්, නියසින් සහ රයිබොෆ්ලේවින් ය. 3. රයිබොෆ්ලේවින්, විටමින් $B_{12}$ සහ බයොටින් ය.
4. විටමින් A, විටමින් D සහ විටමින් C ය. 5. විටමින් $B_2$ විටමින් E සහ විටමින් K ය.

52. සිගරට් දුම් පිළබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. එයට දීර්ඝකාලීන ලෙස නිරාවරණය වීම නිසා ශ්වසන මාර්ගය අපිච්ඡදයේ ජනක ස්තරයේ සෙලවල ක්‍රියාකාරීත්වය අඩු වේ.
2. එය ශ්වසන මාර්ග අපිච්ඡදයේ ඇති කලස් සෙල හා පක්ෂ්මධර පරිවහනය කිරීම වැඩි කරයි.
3. එය හෘත් ස්පන්දන ශීඝ්‍රතාව සහ රුධිරය ඔස්සේ ඔක්සිජන් පරිවහනය කිරීම වැඩි කරයි.
4. එය පර්යන්ත රුධිර වාහිනී විස්තාරණය කර සමට සැපයෙන රුධිර ප්‍රමාණය වැඩි කරයි.
5. එය පෙනහැලි පටකයෙන් ජාරක එන්සයිම විශාල ප්‍රමාණයක් නිදහස් කිරීමට දායක වේ.

53. හෙපරින් ස්‍රාවය කළ හැක්කේ පහත සඳහන් සුදු රුධිරාණු අතුරෙන් කුමකට ද?
1. නියුට්‍රොපිල 2. බේසොපිල 3. ඉයොසිනොපිල 4. මොනොසයිට 5. වසා සෙල

54. මිනිසාගේ වසා පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. අන්තරාල තරලයෙන් අධික ප්‍රමාණයක් මෙම පද්ධතිය මගින් එකතු කෙරේ.
2. එය රුධිර සංසරණ පද්ධතිය හා සම්බන්ධ ය. 3. පේයර් පුල්ලි වසා පද්ධතියේ කොටසකි.
4. එය ප්‍රතිශක්ති ප්‍රතිචාර හා සම්බන්ධ ය. 5. ශිරා මෙන්, වසා වාහිනී ද කපාට නොදරයි.

55. මිනිසාගේ හයිපොතැලමය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
(1) එය කලල පෙර මොළයෙන් විකසනය වී ඇත. (2) එය පෝෂි හෝර්මෝන නිදහස් කරයි.
(3) තාපයාමන මධ්‍යස්ථානය එහි පිහිටයි. (4) එය කුසගින්න හා පිපාසය යාමනය කරයි.
(5) එය මොළයේ හුවමාරු මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරයි.

56. මිනිසාගේ ස්වයංසාධක ස්නායු පද්ධතිය පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
(1) එය සමස්ථිතියේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
(2) හදිසි සහ පීඩාකාරී අවස්ථාවන් හි දී එහි අනුවේගී ක්‍රියාකාරීත්වය වඩාත් ප්‍රබල වේ.
(3) ප්‍රත්‍යානුවේගී පද්ධතියේ පූර්ව ගැංග්ලියමීය තන්තු කෙටිය.
(4) අනුවේගී උත්තේජනය ශ්වාසනාලිකා විස්තාරණය කරයි.
(5) ප්‍රත්‍යානුවේගී උත්තේජනය ක්ෂුද්‍රාන්ත්‍රයේ ක්‍රමාංකුචනය සහ ස්‍රාවයන් වැඩි කරයි.

57. පහත සඳහන් හෝර්මෝන අතුරෙන් ආතති තත්ත්වයන් සමග අවම සම්බන්ධතාවයක් දැක්වීමට ඉඩ ඇත්තේ කුමන හෝර්මෝනයද?
(1) ACTH (2) කෝටිසොල් (3) තයිරොක්සීන්
(4) ඇල්ඩොස්ටෙරෝන් (5) නොර්ඇඩ්රිනලීන් / නොඑපිනෙෆ්රින්



Scanned with CamScanner

58. ප්‍රතිග්‍රාහක පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
(1) ඒවා සම්ප්‍රේෂණ පරිවර්තක ලෙස ක්‍රියාකරයි.
(2) සමහර ප්‍රතිග්‍රාහක සන්තතිකව උත්තේජනය වූ විට ප්‍රතිචාරය අඩු වේ.
(3) ඒවා සෑම විටම ස්නායු පද්ධතියට සම්බන්ධ ය.
(4) මිනිසාගේ සමේ නිදහස් ස්නායු අග්‍ර විශිෂ්ට තාපප්‍රතිග්‍රාහක ලෙස ක්‍රියා කරයි.
(5) මර්කල් මඩල යාන්ත්‍රප්‍රතිග්‍රාහක වේ.

59. බහිස්‍රාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. එය ජීවය සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි.
2. බහිස්‍රාවී ඵලයක් ලෙස ඇමෝනියා නිපදවීමට ශක්තිය අවශ්‍ය නොවේ.
3. බහිස්‍රාවී ඵලයක් ලෙස යූරික් අම්ලය නිපදවීමේදී කාබන් හානිය අධික ය.
4. ක්ෂීරපායින්ගේ නයිට්‍රජනීය බහිස්‍රාවයේ ප්‍රථම ඵලය යූරියා ය.
5. බහිස්‍රාවී ඵලයක් ලෙස යූරික් අම්ලය නිපදවීමේදී ජල සංරක්ෂණය උපරිම වේ.

60. නයිට්‍රජනීය බහිස්ස්‍රාවයේ අන්තඃඵලයක් නොවන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක්ද?
(1) ඇමෝනියා (2) යූරියා (3) ක්‍රියටිනින් (4) යූරික් අම්ලය (5) පිත් වර්ණක

61. කංකාල පේශි තන්තුවක සායොමීයරය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
(1) එය පේශි සංකෝචනයේ ක්‍රියාකාරී ඒකකයයි. (2) එය යාබද $Z$ - රේඛා දෙකක් අතර ප්‍රදේශයයි.
(3) $I$ - පටියේ ඇත්තේ සිහින් සූත්‍රිකා පමණි. (4) පේශි සංකෝචනයේදී $A$ - පටිය කෙටි වේ.
(5) පේශි සංකෝචනයේදී $H$ - කලාපය අඩු වේ.

62. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අස්ථි සහ කාටිලේජ යන දෙවර්ගයම පිළිබඳ වැරදි වන්නේ කුමක් ද.?
1. දෙවර්ගයම විශේෂිත සම්බන්ධක පටක වේ. 2. දෙවර්ගයේ ම ගර්තිකා ඇත.
3. දෙවර්ගයම සංධාරණය සපයන අතර සන්ධිවලදී චලනය සඳහා ආධාර වේ.
4. දෙවර්ගයම රුධිර වාහිනී දරයි. 5. දෙවර්ගයේම පූරකයේ කොලැජන් ඇත.

63. මානව කිරි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?
(1) එහි සංශ්ලේෂණය හා නිදහස් වීම ප්‍රොලැක්ටින් මඟින් යාමනය වේ.
(2) සුක්‍රෝස් නිසා එය පැණිරසය. (3) කිරිදෙන වාරයක් පාසා එහි සංයුතිය වෙනස් වේ.
(4) එය සෝඩියම් හා කැල්සියම් අයනවලින් පොහොසත්ය.
(5) අලුත උපන් ළදරුවෙකුට මාස 12ක් පමණ වයස් වන තෙක් එකම ආහාර ප්‍රභවය ලෙස එයට ක්‍රියා කළ හැකිය.

64. මිනිස් ශුක්‍රාණුවල අධිසක්‍රියතාව පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
(1) අධිසක්‍රියවීමේදී ශුකාණුවේ ප්ලාස්ම පටලයේ ඇති සමහර ග්ලයිකොප්‍රෝටීන වෙනස් වේ.
(2) අධිචාලක ශුක්‍රාණු ට්‍රිප්සින් මුදා හරි, (3) අග්‍රදේහ ප්‍රතික්‍රියාව සිදුවන්නේ අධිසක්‍රිය ශුක්‍රාණුවල පමණි.
(4) අධිසක්‍රිය ශුක්‍රාණුවලට පැදී කලාපයේ ප්‍රතිග්‍රාහකවලට සම්බන්ධ විය හැකිය.
(5) අධිසක්‍රියවීම ආරම්භ වනුයේ අපිවෘෂණයේදීය.

65. දරු ප්‍රසූතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?
(1) එය සාමාන්‍යයෙන් සංසේචනයෙන් සති 36 කට පසු සිදු වේ.
(3) දරු ප්‍රසූතිය සඳහා සංඥාව ලැබෙනුයේ භ්‍රෑණයෙනි.
(2) එය මයෝමෙට්‍රියමේ සිනිඳු පේශිවල ප්‍රබල රිද්මාකාර සංකෝචන ශ්‍රේණියක් නිසා සිදු වේ.
(4) දරු ප්‍රසූතියට සතියකට පමණ පෙර ප්‍රොජෙස්ටරොන් මඟින් මයෝමේට්‍රියමේ ඔක්සිටොසින් ප්‍රතිග්‍රාහක සෑදීම ක්‍රියාරම්භ කෙරේ.
(5) දරු ප්‍රසූතියේදී ඔක්සිටොසින් මුදාහැරීම සඳහා කාර්යභාරයක් ගර්භාෂයේ ප්‍රසාර ප්‍රතිග්‍රාහක ඉටු කරයි.



Scanned with CamScanner

66. සිනිඳු පේශි තන්තු පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?/ කුමන ඒවාද?

(A) එම තන්තු දිගු හා ශාඛනය වූ ඒවාය. (B) ඒවා සාකොමියර දරයි.

(C) ඒවා පහසුවෙන් විඩාවට පත් වේ. (D) ඒවා පහසුවෙන් විඩාවට පත් නොවේ.

(E) ඒවා බහුන්‍යෂ්ටික වේ.

67. විටමින පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?

(1) සාමාන්‍ය පරිවෘත්තිය සහ සෞඛ්‍ය සඳහා ඒවා අත්‍යවශ්‍ය ය.

(2) මිනිස් දේහය තුළ කිසිම විටමිනයක් නිපදවන්නේ නැත.

(3) විටමින් $B_{12}$ අවශෝෂණය වීම සඳහා ආමාශය මගින් නිපදවෙන අභ්‍යන්තරස්ථ සාධකයක් අවශ්‍යය.

(4) මිනිසාගේ කොලැජන් සංශ්ලේෂණය කිරීමට සහ පවත්වා ගැනීමට විටමින් C අවශ්‍ය ය.

(5) ෆෝලික් අම්ල ඌනතාව නිසා මිනිසාට රක්තහීනතාව ඇති විය හැකි ය.

68. නොගැලපෙන යුගලය තෝරන්න.

(1) හිමොඑරිත්‍රින් - ඇනලීඩාවන් (2) ශ්වාසනාල - ශ්වාසරන්ධ්‍ර

(3) නියුමොටැක්සික් මධ්‍යස්ථානය - සුෂුම්නා ශීර්ෂකය (4) ප්‍රාචීරය ඉහිල් වීම - ප්‍රාශ්වාසය

(5) විවේකීව සිටින විට මිනිසාගේ උදම් පරිමාව - 500 ml පමණ

70. මිනිසාගේ රුගේ නැමුම් දක්නට ලැබෙනුයේ,

(1) ග්‍රහණියේ ය. (2) මහාන්ත්‍රයේ ය. (3) ආමාශයේ ය.

(4) ශූන්‍යාන්ත්‍රකයේ ය. (5) ශේෂාන්ත්‍රකයේ ය.

71. අංගුලිකාවල රුධිර වාහිනීවලට අවශෝෂණය නොවන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) ජලය (2) ඛනිජ ලවණ (3) ඇමයිනෝ අම්ල (4) මේද අම්ල (5) ගැලැක්ටෝස්

72. නියුරෝනයක ක්‍රියා විභවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?

(1) එය සිදුවන්නේ අක්සොලෙමාවේ ය.

(2) එය නිපදවීම සඳහා $Na^+$ සහ $K^+$ යන දෙක ම අත්‍යවශ්‍ය ය.

(3) මයලිනිභූත ස්නායුවල එය සිදුවන්නේ රැන්වියර් ගැටවල පමණි.

(4) එයට අනුශාඛිකාවක් ඔස්සේ සම්ප්‍රේෂණය වීමට පුළුවන. (5) එය නිපදවීමට ATP අවශ්‍ය ය.

73. පහත සඳහන් එන්සයිම අතුරෙන් ආහාර සංඝටකයක් මත ක්‍රියා නොකරන්නේ කුමක් ද?

(1) ලැක්ටේස් (2) රෙනින් (3) කයිමොට්‍රිප්සින් (4) එන්ටෙරොකයිනේස් (5) පෙප්සින්

74. ගැස්ට්‍රයිටිස් සඳහා දායක වන සාධකයක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

1. මද්‍යසාර භාවිතය 2. උදෑසන ආහාර වේල නොගැනීම 3. ක්ෂය රෝගය

4. මානසික ආතතිය 5. තන්තු ඌන ආහාර ගැනීම

75. සත්ව රාජධානිය තුළ දැකිය හැකි ශ්වසන ව්‍යූහ සමහරක් පහත දැක්වේ.

A. පෙනහැලි B. පත් පෙනහැලි C. ශ්වාසනාල D. අභ්‍යන්තර ජලක්ලෝම

E. බාහිර ජලක්ලෝම F. සම

පෘෂ්ඨවංශීන් ශ්වසන වායු හුවමාරුව සඳහා භාවිත කරනුයේ ඉහත සඳහන් ඒවායින් කුමක් ද? / කුමන ඒවාද?

1. A පමණි. 2. A සහ D පමණි. 3. A, D සහ E පමණි.

4. A, D, E සහ F පමණි. 5. A, C, D, E සහ F පමණි.

76. සතුන් අතර දක්නට ලැබෙන රුධිර සංසරණ පද්ධති මෙසේ ය.

A විවෘත සංසරණ පද්ධතිය B සංවෘත ඒක සංසරණ පද්ධතිය

C සංවෘත ද්විත්ව සංසරණ පද්ධතිය



Scanned with CamScanner

ඉහත සඳහන් A,B,C රුධිර සංසරණ පද්ධති ඇති සතුන් නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

1. මකුළුවා, ගොළුබෙල්ලා සහ මීයා
2. පත්තෑයා, Ichthyophis සහ වවුලා
3. කකුළුවා, ගැඩවිලා, සහ කැස්බෑවා
4. මුහුදු ඉකිරියා, මෝරා සහ කපුටා
5. කැරපොත්තා, *Nereis* සහ බූවල්ලා

77. කිසියම් පුද්ගලයෙකුගේ වැරෝලි සේතුව සහ තැලමස අතර අර්බුදයක් ඇතිවීම නිසා මොළයේ එම ප්‍රදේශයෙන් කරනු ලබන ක්‍රියාවට බලපෑමක් ඇතිවිය. මෙම අර්බුදය නිසා වඩාත්ම බලපෑමක් ඇතිවිය හැක්කේ පහත සඳහන් ඒවා යින් කුමකට ද?

1. ඇස්වල චලනය
2. තුලනතාව පවත්වා ගැනීම
3. මතකය
4. ශ්වසනය පාලනය කිරීම
5. කථනය

78. ආවේගයක් සන්නයනය නොකරන අවස්ථාවේ ඇති මිනිසාගේ චාලක නියුරෝනයක් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ කුමක් ද?

1. ඇතුළට පැමිණෙන ඇනායන සංඛ්‍යාව පිටතට යන ඇනායන සංඛ්‍යාවට වඩා වැඩි හෙයින් ප්ලාස්ම පටලයේ අභ්‍යන්තර පෘෂ්ටය බාහිරයට සාපේක්ෂව සෘණ ලෙස ආරෝපණය වී ඇත.
2. නියුරෝණය තුළ ඇති ප්‍රධාන ඇනායනය $Cl^-$ ය.
3. නියුරෝණය තුළ $Na^+$ වල සහ කාබනික ඇනායන වල සාන්ද්‍රණය බාහිරයට වඩා වැඩිය.
4. වාහක ප්‍රෝටීන් වල සහභාගිත්වය සිදුකෙරෙන සක්‍රිය පරිවහනය මගින් $Na^+ K^+$ පොම්පය පවත්වාගනී.
5. ප්ලාස්ම පටලයේ $Na^+$ සඳහා ඇති පාරගම්‍යතාවය $K^+$ සඳහා ඇති පාරගම්‍යතාවට වඩා වැඩි ය.

79. කෝර්ටි අවයවය පිහිටන ස්ථානය වඩාත් ම හොඳින් දක්වනුයේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) කර්ණශංඛය
(2) කර්ණශංඛ නාලය
(3) ඇතුළු කන
(4) පටලමය ගහනය
(5) සෞත්‍රිකාව

80. සත්ත්ව රාජධානිය තුළ දැකිය හැකි බහිස්‍රාවී ව්‍යුහ සමහරක් සහ එම ව්‍යුහ දරන සතුන්ට නිදසුන් පහත දක්වා ඇත. එම බහිස්‍රාවී ව්‍යුහය - නිදසුන සම්බන්ධතා අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?

(i) ලවණ ග්‍රන්ථි - තිලාපියා
(ii) හරිත ග්‍රන්ථි - ඉස්සා
(iii) වෘක්කිකා - කුඩැල්ලා
(iv) සිළු සෛල - *Bipalium*
(v) මැල්පිගීය නාලිකා - මී මැස්සා

81. මිනිසාගේ හොඳින් වැඩුනු කශේරුකා දේහයක්, දිගු ස්නායු මාර්ග කණ්ටකයක් සහ දිගු තීර්යක් ප්‍රසර දක්නට ලැබෙනුයේ,

(i) කටි කශේරුකාවල පමණි.
(ii) උරස් කශේරුකාවල පමණි.
(iii) කටි සහ උරස් කශේරුකාවල පමණි.
(iv) 6 වැනි ග්‍රෛවී, කටි සහ උරස් කශේරුකාවල පමණි.
(v) උරස්, කටි සහ ත්‍රිකාසිරික කශේරුකාවල පමණි.

82. මිනිසාගේ අවයවයක හරස්කඩක් අන්වීක්ෂයෙන් පරීක්ෂා කළවිට පක්ෂ්මධර සෛල, කලස් සෛල සහ සෛල එකක් හෝ දෙකක් හෝ දරන ගර්තිකා නිරීක්ෂණය කරන ලදි. මෙම අවයවය විය හැක්කේ,

(i) අක්මාවයි. (ii) ශ්වාසනාලයයි. (iii) ඩිම්බ ප්‍රණාලයයි. (iv) අන්ත්‍රයයි. (v) වෘක්කයයි.

83. මෙම ප්‍රශ්නය පහත සඳහන් සත්ත්ව කාණ්ඩ මත පදනම් වේ.

A. ක්‍රස්ටේෂියා B. වර්ටිබ්‍රේටා C. මොලස්කා D. රේඩියොලේරියා

පිටසැකිල්ලක් දරන සතුන් මෙන් ම ඇතුළු සැකිල්ලක් දරන සතුන් ද අන්තර්ගත වනුයේ ඉහත සඳහන් කුමන කාණ්ඩයේ ද?/කාණ්ඩවලද?

(i) B පමණි.
(ii) B සහ C පමණි.
(iii) B,C සහ D පමණි.
(iv) A සහ C පමණි.
(v) A සහ D පමණි.



Scanned with CamScanner

84. මෙම ප්‍රශ්නය මිනිස් ඩිම්බය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ මත පදනම් වේ.

A. ඩිම්බ මෝචනය අවස්ථාවේදී එය ප්‍රථම ඌනන විභාජනයේ යෝගකලාවේ පිහිටයි.
B. ඩිම්බ මෝචනය සිදුවූ විගස ම එය ප්‍රථම ධ්‍රැවීය දේහය නිදහස් කරයි.
C. අරිය මුකුටයේ කණිකාමය සෛල එයට සම්බන්ධ වී ඇති බැවින් එය බහු සෛලීය වේ.
D. බීජාන්නය ඉතා සුළු ප්‍රමාණයක් සහිත ඝන සෛලප්ලාස්මයක් එහි ඇත.
E. එය සාමාන්‍යයෙන් සංසේචනය වනුයේ පැලෝපීය නාලයේදී ය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද? /කුමන ඒවා ද?

(i) A සහ B පමණි. (ii) A, B සහ C පමණි. (iii) B,C,D සහ E පමණි.
(iv) D සහ E පමණි. (v) E පමණි.

85. මිනිසාගේ ශුක්‍ර තරලය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?

(1) එහි PH අගය 6.5 - 7.0 වේ. (2) එහි ඇස්කෝබික් අම්ලය ඇත.
(3) එහි 40% ක් පමණ ස්‍රාවය වනුයේ ශුක්‍ර ආශයිකාවලිනි.
(4) ශුක්‍රාණුවල චලනය සඳහා අවශ්‍ය ශක්තිය සැපයීමට එහි ප්‍රෝටීන ඇත.
(5) ශුක්‍රාණුවල අධිසක්‍රියකරණය සඳහා හේතුවන ද්‍රව්‍ය එහි ඇත.

86. මිනිසාගේ ප්‍රතීක චාප පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද? /කුමන ඒවාද?

A. අනුවිජානුග ක්‍රියා රැසක් පාලනය කිරීමට ඒවා උපකාරී වේ.
B. ඒවා සාමාන්‍යයෙන් නියුරෝන දෙකකින් සමන්විත වේ.
C. ඒවායේ සහභාගිත්වය නිසා ඇතිවන ප්‍රතිචාර ස්වයංක්‍රීය වේ.
D. ඒවා ස්නායු පද්ධතියේ කෘත්‍යමය ඒකකයි.
E. ඒවා ස්වයංසාධක ස්නායු පද්ධතිය හරහා ප්‍රතිග්‍රාහක හා කාරක අවයව සම්බන්ධ කරයි.

87. මිනිසාගේ සම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද? / කුමන ඒවාද?

A. මූලික පටක වර්ග හතර ම චර්මයේ දැකීමට පුළුවන
B. එය ලවණ සහ යූරියා බහිස්‍රාවය කරයි. C. ස්නායු අග්‍ර අපිචර්මය තුළට නොවිහිදේ.
D. අපිචර්මය ග්‍රන්ථි සහිත ස්තරිභූත ශල්කමය අපිච්ඡදයකි. E. එය විටමින් D සංශ්ලේෂණය කරයි.

88. වෘක්කයේ ක්‍රියාකාරිත්වය යාමනය කිරීම සඳහා දායක වන හෝර්මෝන ස්‍රාවය කරනුයේ මිනිසාගේ පහත දැක්වෙන කුමන අන්තරාසර්ග ග්‍රන්ථි ද?

A. හයිපොතැලමස, අධිවෘක්ක මජ්ජාව, අපර පිටියුටරිය
B. අපර පිටියුටරිය, අධිවෘක්ක බාහිකය, තයිමස
C. පූර්ව පිටියුටරිය, හයිපොතැලමස, අපර පිටියුටරිය
D. හයිපොතැලමස, පැරාතයිරොයිඩ, අධිවෘක්ක බාහිකය
E. හයිපොතැලමස, තයිරොයිඩය, අග්න්‍යාශය

89. මිනිසාගේ වෘක්කය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද? / කුමන ඒවා ද?

A. බාහික වෘක්කාණුවල ගුච්ඡිකාවල ඇති කේශනාලිකා සංඛ්‍යාව ජක්ෂ්ට - මජ්ජා වෘක්කාණුවල ගුච්ඡිකාවල ඇති කේශනාලිකා සංඛ්‍යාවට වඩා අඩුය.
B. වෘක්කය තුළදී කිසිවිටෙකත් ජලය සක්‍රිය ලෙස නැවත අවශෝෂණය නොකෙරේ.
C. වෘක්කය තුළදී ඇමයිනෝ අම්ල සක්‍රිය ලෙස නැවත අවශෝෂණය කෙරේ.
D. වැඩිපුර ඇති විටමින් D වෘක්කයේදී ස්‍රාවය කෙරේ.
E. උරස් කශේරුකා ද වෘක්කය හා සම මට්ටමේ පිහිටා ඇත.

90. සය මසක් වයසැති මිනිස් පිරිමි භ්‍රෑණයක දැකිය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක් ද? / කුමන ඒවාද?

A. රැළි වැටුනු සම B. ඇහි පිහාටු C. හා වූ ඇසිපිය
D. ඇඟිලිවල කෙළවර දක්වා දික් වූ නිය E. අවරෝහණය වූ වෘෂණ සහිත වෘෂණ කෝෂය



Scanned with CamScanner

91. මිනිසාගේ පේශි තන්තු කිහිපයක් අන්වීක්ෂයෙන් පරීක්ෂා කළ විට ඒවා ශාඛනය නොවූ බහුන්‍යෂ්ටික ඒවා නිරීක්ෂණය කරන ලදි. මෙම තන්තු ලබාගත් පේශිය
(1) ස්වයංසාධක ස්නායු පද්ධතියෙන් ස්නායුතනනය වන අතර ස්නායුජන්‍ය වේ.
(2) විලේඛ සහ අන්තරස්ථාපිත මඬල නොදරයි.
(3) ප්‍රබල සංකෝචන ඇති කරන අතර විඩාවට පත් නොවේ.
(4) විලිඛිත ඉච්ඡානුග පේශියකි.
(5) සෙමින් සංකෝචනය වන අතර පහසුවෙන් විඩාවට පත් වේ.

92. මිනිසාගේ ශුක්‍රාණුජනනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) එය යොවුනුදාවේ දී ආරම්භ වී වයස අවුරුදු 55 පමණ වන විට නවතී.
(2) පූර්ව පිටියුටරියෙන් ස්‍රාවය වන LH මඟින් එය ආරම්භ වේ.
(3) එය පවත්වා ගැනීම සඳහා ලේඩිග් සෛලවලින් ස්‍රාවය වන ටෙස්ටොස්ටෙරෝන් අවශ්‍ය වේ.
(4) ප්‍රාථමික ශුක්‍රාණු සෛලවල ඌනන විභාජනය සම්පූර්ණ වීමට ප්‍රථම ද්විතීයික ශුක්‍රාණු සෛල නිපදවේ.
(5) 37 $^0$C දක්වා උෂ්ණත්වයත් සමග එය ක්‍රමයෙන් වැඩි වී ඉන්පසු ශීඝ්‍රයෙන්අඩු වේ.

93. මෑතකදී ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවසක වසන ලද ගරාජයක නවතා තිබූ මෝටර් රථයක් තුළ ළමයින් කිහිප දෙනෙකු මැරී සිටි බව වාර්තා විය. ඔවුන්ගේ ඇඟේ කිසිදු තුවාලයක් නොතිබුණු අතර මෝටර් රථයේ ඇන්ජිම ක්‍රියාත්මකව තිබුනි. ඔවුන්ගේ මරණයට වඩාත්ම හේතු විය හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
1. කාබොනික් ඇන්හයිඩ්‍රේස් එන්සයිමය අක්‍රිය වීම
2. රුධිරයේ කාබොක්සිහීමොග්ලොබින් නිපදවීම
3. රුධිරයේ කාබ්ඇමයිනෝහීමොග්ලොබින් නිපදවීම
4. දුම් නිසා ශ්වසන මාර්ගය අවහිර වීම
5. පෙනහැලි හරහා ඊයම් අවශෝෂණය වීම

94. ප්‍රතිබිම්භ නොසාදන ප්‍රභාප්‍රතිග්‍රාහක දැකිය හැක්කේ
(1) මී මැස්සාගේය.
(2) දැල්ලාගේය.
(3) ලොඩියාගේය.
(4) *Planaria* ගේය.
(5) ගොළුබෙල්ලාගේය.

95. ප්‍රතිජීවක අධික ලෙස අධිග්‍රණය කිරීම නිසා පහත සඳහන් කුමන විටමින / විටමිනය ඌන විය හැකි ද?
(A) බයොටින්
(B) විටමින් K
(C) විටමින් C
(D) ෆෝලික් අම්ලය
(E) විටමින් A

96. මිනිසාගේ පහත සඳහන් කුමන අවයවය / අවයව වෘක්කය මත ක්‍රියා කරන හෝර්මෝන නිපදවයි ද?
(A) පූර්ව පිටියුටරිය
(B) අධිවෘක්ක මජ්ජාව
(C) අපර පිටියුටරිය
(D) පැරාතයිරොයිඩ
(E) අග්න්‍යාසය

97. ග්‍රහණිය මගින් ස්‍රාවය කෙරෙනුයේ පහත සඳහන් හෝර්මෝන අතරෙන් කුමක් ද?/ කුමන ඒවා ද?
(A) එන්ටරොගැස්ට්‍රෝන්
(B) කොලිසිස්ටොකයිනින් - පැන්ක්‍රියොසයිමින්
(C) ගැස්ට්‍රින්
(D) සික්‍රටින්
(E) එරිත්‍රොපොයිටින්

98. මානව ශ්වසන පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
01. පෙනහැලිවල ක්‍රියාකාරී ඒකක ගර්ත ය.
02. පෙනහැල්ලේ ජීව ධාරිතාව 3.5 $dm^3$ වේ.
03. ශ්වාසනාලිකා පක්ෂ්මධර ව්‍යාජ ස්තම්භික අපිච්ඡද සෛලවලින් ආස්තරණය වේ.
04. අනුශ්වාසනාලිකාවල කාටිලේජ ඇත.
05. නාස්කුහරය හා මුඛ කුහරය යන දෙකම සමඟ ග්‍රසනිකාව සම්බන්ධ වේ.

99. මානව රුධිරය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
01. එය සුළු වශයෙන් ආම්ලික ය. 02. සුදු රුධිරාණු බහුතරයක් කණිකාමය නොවන සෛල වේ.
03. හිමොග්ලොබින් කාබන් මොනොක්සයිඩ්වලට වඩා වැඩි බන්ධුතාවක් ඔක්සිජන්වලට දක්වයි.
04. එය සමස්ථිතිය පවත්වා ගැනීමට උපකාරී වේ.
05. O රුධිර ගණය සහිත පුද්ගලයෙකුට A සහ B ඇග්ලුටිනෝජන් දෙවර්ගයම ඇත.

100. මානව හෘදය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
01. එය දිගු සිලින්ඩරාකාර තන්තුවලින් සමන්විත වේ.
02. දකුණු හෘත්කර්ණිකකෝෂික කපාටය ද්විතුණ්ඩ වේ.
03. ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය උත්තේජනය වීම නිසා හෘත් ස්පන්දන ශීඝ්‍රතාව වැඩි වේ.
04. හෘත් කර්ණිකා අංකුවයේ කාල සීමාව තත්පර 0.1 කි.
05. හෘත් කෝෂික විධ්‍රැවණය, විද්‍යුත් කන්තුක රේඛා සටහනක (ECG),T තරංගයෙන් නිරූපණය වේ.

101. මානව ප්‍රතිග්‍රාහක පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) ඒවා එක් ශක්ති ආකාරයක් ස්නායු ආවේග බවට පරිණාමනය කරයි.
(2) සන්තතික ලෙස උත්තේජනය වීම නිසා සමහර ප්‍රතිග්‍රාහක වල ක්‍රියාකාරීත්වය අඩු වේ.
(3) පැසිනි දේහාණු යාන්ත්‍ර ප්‍රතිග්‍රාහක වේ. (4) කෝටි අවයවය කම්පන ප්‍රතිග්‍රාහක දරයි.
(5) ක්‍රවුස් බල්බ ඉහළ උෂ්ණත්වවලට සංවේදී වේ.

102. මානව මොළය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) තැලමස ව්‍යුත්පන්න වනුයේ කලල පෙර මොළයෙනි.
(2) අනුමස්තිෂ්කයේ පෘෂ්ඨය තැනෙනුයේ ශ්වේත ද්‍රව්‍යයෙනි. (3) එහි විශාල කුහර හතරක් ඇත.
(4) පිටියුටරියේ අන්තරාසර්ග කෘත්‍ය හයිපොතැලමස මඟින් යාමනය වේ.
(5) මස්තිෂ්කයේ සංවේදී ප්‍රදේශයේ වැඩි නියෝජනයක් ඇත්තේ අතට ය.

103. සමායෝජනය සඳහා අඩුවෙන් ම දායක වනුයේ පහත සඳහන් කුමන පද්ධතිය ද ?
(1) සංසරණ පද්ධතිය (2) පේශි පද්ධතිය (3) අන්තරාසර්ග පද්ධතිය
(4) ජීර්ණ පද්ධතිය (5) ස්නායු පද්ධතිය

104. ක්‍රියා විභවයක පහතසඳහන් කුමන ගුණාංගය ස්නායු ආවේගයක් පසු පසට සන්නයනය වීම වලක්වයිද?
(1) උපරිධ්‍රැවණ කාලය (2) ප්‍රතිධ්‍රැවණ කාලය (3) අනස්සව කාලය
(4) විධ්‍රැවණ කලාව (5) කාල සීමාව

105. බහිස්‍රාවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) බිලිරුබින් බහිස්‍රාවී ඵලයක් ලෙස සැලකේ.
(4) මිනිසාගේ යූරියා නිපදවන ප්‍රධාන ස්ථානය වෘක්කයයි.
(2) සෑම සතෙකුගේ ම ප්‍රථම නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය ඇමෝනියා වේ.
(3) දේහයෙන් සිදුවන කාබන් හානිය සැලකූ විට යූරික් අම්ල නිෂ්පාදනය අවාසිදායක වේ.
(5) වෘක්කිකා දේහයේ අභ්‍යන්තරයට හා බාහිරයට විවෘත වේ.

106. මානව ඉහල ගාත්‍රය මඟින් බරක් එසවීමේදී පහත සඳහන් ඒවායින් කවරක් අඩුම වශයෙන් දායක වේද?
(1) දිගු සහ ශක්තිමත් ප්‍රගන්ඩාස්ථිය (2) නිකුබ්ජනය (3) උත්කුබ්ජනය
(4) යථාතථ්‍ය ග්‍රහනය (5) පළල් අත්ල

107. මානව සිනිඳු පේශි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ඒවා සියල්ල රිද්මාකාර සංකෝචන දක්වයි.
(2) ඒවායේ සංකෝචන ඒකකය සාකොමියර නොවේ. (3) ඒවා ඉක්මනින් විඩාවට පත් වේ.
(4) ඒවා දෛහික ස්නායු පද්ධතියෙන් ස්නායුතනය වේ (5) ඒවා ප්‍රත්‍යස්ථ නොවේ.



Scanned with CamScanner

108. උපත් පාලනය පිලිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. ක්ෂීරණයට උපත් පාලන බලපෑමක් ඇති කිරීමට පුලුවන
2. ගිලින උපත් පාලන පෙති පිටියුටරියේ FSH හා LH නිදහස් කිරීමට බාධා ඇති කරයි.
3. ඩෙපො-ප්‍රොවෙරා ගර්භාෂයික අධිරෝපණය වළකයි. 4. IUD ඩිම්බමෝචනය වළකයි.
5. වාසෙක්ටමි යනු පුරුෂයින් සඳහා ඇති ස්ථිර උපත් පාලන ක්‍රමයකි.

109. මානව ගර්භනීභාවය පිලිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
1. සාමාන්‍යයෙන් එහි කාලසීමාව සංසේචනයෙන් පසු සති 40 ක් පමණ වේ.
2. ගර්භණී කාලයේ දී කළල බන්ධ ප්‍රොජෙස්ටරොන් මයොමෙට්‍රියමේ සංකෝචන මැඩ පවත්වයි.
3. ගර්භනී කාලයේ ප්‍රථම ත්‍රෛමාසිකය අවසානයේ දී භ්‍රෑණය රෝම සහිත රැළි වැටුණු හමක් දරයි.
4. මුත්‍රවල hCG තිබීම ගර්භනීභාවය තහවරු කරයි.
5. ගර්භනී කාලයේ අවසාන කාලයේ දී ඊස්ට්‍රජන් මගින් මයෝමෙට්‍රියමේ ඔක්සිටොසින් ප්‍රතිග්‍රාහක සෑදීම උත්තේජනය කෙරේ.

110. මානව සංසේචනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
1. එය සාමාන්‍යයෙන් සිදුවන්නේ පැලොපීය නාලයේ පහළ 1/3 කොටසේ ය.
2. එය ඩිම්බ මෝචනයෙන් පැය 24 ක් තුළ සිදුවිය යුතුය.
3. මෙම ක්‍රියාවලියේ දී ඩිම්බ පටලය මගින් ශුක්‍රාණු බහු ප්‍රවේශණය වැළැක්වේ.
4. සංසේචනයේ දී ඩිම්බය තුලට මුළු ශුක්‍රාණුව ඇතුළු වේ.
5. කිසිම විටක එය ස්ත්‍රී ප්‍රජනක පද්ධතියෙන් පිටත සිදු නොවේ.

111. මානව අග්න්‍යාශයික යූෂය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවරදි වන්නේ කුමක් ද/කුමන ඒවා ද?
(A) එය ආම්ලික ස්‍රාවයකි (B) එය මේද තෛලෝදකරණය කරයි
(C) එය ස්‍රාවය වීම සික්‍රටින් මගින් උත්තේජනය වේ
(D) ප්‍රෝටියොලිටික එන්සයිමවල අක්‍රිය පූර්වග එහි ඇත
(E) එය ස්‍රාවය වීම ප්‍රත්‍යනුවේගී උත්තේජන නිසා අඩුවේ.

112. වැඩිහිටි සාමාන්‍ය පුරුෂයකුගේ හිස්කබල පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ වැරදි අතුරෙන් කුමක් ද/කුමන ඒවා ද?
(A) එහි කපාල ධාරිතාව ලීටර දෙකක් පමණ වේ. (B) චූචුකාකාර ප්‍රසරය ඇත්තේ යටි හනුවේය.
(C) ඌර්ධවහනු අස්ථියේ වාත කෝටරක ඇත. (D) මුහුණු ප්‍රදේශය අස්ථි 12 කින් තැනී ඇත.
(E) උඩු හනුවේ වාර්වක හයක් ඇත.

113. මානව හෝර්මෝන පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවරදි කුමක් ද/ කුමන ඒවා ද?
(A) එරිත්‍රොපොයිටින් ක්‍රියා කරනුයේ අස්ථි තුළ පමණි.
(B) කිරි නිකුත් කිරීමේදී ප්‍රොලැක්ටින් වැදගත් කාර්‍යභාරයක් ඉටු කරයි
(C) ග්ලූකගන් සහ කෝටිසොල් යන දෙවර්ගය ම රුධිර ග්ලූකෝස් මට්ටම වැඩි කරයි
(D) ADH සහ ඇල්ඩොස්ටෙරෝන් යන දෙවර්ගයටම වෘක්කාණු තුලදී ජලය ප්‍රතිශෝෂනය වෙනස් කිරීමට පුළුවන (E) පැරාතයිරොයිඩ් හෝර්මෝනය රුධිර කැල්සියම් මට්ටම අඩු කරයි.

114. මිනිස් වෘක්කාණුව පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද/ කුමන ඒවා ද?
(A) ජලය ප්‍රතිශෝෂණය අවිදූර සංවලිත නාලිකාවේදී, හෙන්ලේ පුඩුවේ ආරෝහණ බාහුවේදී සහ විදූර සංවලිත නාලිකාවේදී සිදු විය හැක.
(B) අවිදූර සංවලිත නාලිකාවේදී යූරියා සක්‍රීය ලෙස අවශෝෂනය කෙරේ
(C) ජක්ස්ටමජ්ජා වෘක්කාණුවලට දිග හෙන්ලේ පුඩු ඇත
(D) $Na^{+}$ ප්‍රතිශෝෂනය සෑම විටම සක්‍රියව සිදු වේ
(E) එය රුධිර පරිමාව පවත්වා ගැනීමට උපකාරී වේ



Scanned with CamScanner

115. මිනිසාගේ ශුක්‍රාණුජනනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද/කුමන ඒවාද?

(A) එය ආරම්භ වූ පසු සන්තතිකව සිදුවන ක්‍රියාවලියකි (B) එහි කාලසීමාව දින 75 ක් පමණ වේ.

(C) එය ප්‍රශස්ත ලෙස සිදුවනුයේ දේහ උෂ්ණත්වයේදී දීය (E) එය FSH මගින් ආරම්භ කරනු ලබයි.

(D) ශුක්‍රාණු මාතෘ සෛල ප්‍රාථමික ශුක්‍රාණු සෛල බවට පත්වන විට ඌනනය සිදුවේ.

116. මිනිසාගේ SA ගැටය පිළබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) එය දකුණු හෘත් කර්ණිකාවේ බිත්තියේ අන්තර්හෘත්කර්ණික ආවාරයට ආසන්නව පිහිටයි.

(2) පර්කින්ජේ තන්තු එයින් ආරම්භ වේ. (3) එය ස්නායු පටකයෙන් සමන්විත ය.

(4) හෘදයේ ගතිකරයෙන් ලැබෙන ආවේග මගින් එය උත්තේජනය වේ.

(5) හෘත් ස්පන්දනය සඳහා උත්තේජනය එයින් ආරම්භ වේ.

117. නයිට්‍රජනීය බහිස්‍රාවයේ අන්ත ඵල පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) පෘෂ්ඨවංශීන්ගේ විෂ අඩු ම නයිට්‍රජනීය බහිස්‍රාවී ද්‍රව්‍ය යූරියා ය.

(2) යූරියාවල අධික ද්‍රාව්‍යතාව නිසා එය බහිස්‍රාවය කිරීමට අධික ජල ප්‍රමාණයක් අවශ්‍ය ය.

(3) යූරියා බහිස්‍රාවය කිරීම නිසා දේහයෙන් සිදු වන කාබන් හානිය අධික ය.

(4) ජලජ පක්ෂීන්ගේ ප්‍රධාන නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලය යූරික් අම්ලය ය.

(5) ක්‍රියටීන් යනු ක්ෂීරපායීන්ගේ නයිට්‍රජනීය බහිස්‍රාවී ඵලයකි.

118. කිසියම් පුද්ගලයෙකුගේ මූත්‍රවල ප්‍රෝටීන ඇත්නම් ඔහුගේ පහත සඳහන් කුමන ව්‍යුහයට හානි වී තිබිය හැකි ද?

(1) බෝමන් ප්‍රාවරය (2) අවිදූර සංවලිත නාලිකාව (3) විදූර සංවලිත නාලිකාව

(4) හෙන්ලේ පුඩුවේ අවරෝහණ බාහුව (5) ගුච්ඡිකාව

119. මිනිසාගේ කංකාල පේශි සංකෝචනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වනුයේ කුමක් ද?

(1) එය ආරම්භ වීම සඳහා චාලක ස්නායු උත්තේජනයක් අත්‍යාවශ්‍ය.

(2) මයොසින් හිස් සහ ඇක්ටින් බන්ධන ස්ථාන අතර හරස් සේතු සෑදේ.

(3) ඇක්ටින් සූත්‍රිකා කෙටි වේ. (4) I - පටි කෙටි වේ.

(5) හරස් සේතු සෑදීම සඳහා කැල්සියම් අයන අත්‍යවශ්‍ය වේ.

121. ස්නායු පද්ධති පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) සියළුම බහුසෛලීය සතුන් ස්නායු පද්ධතියක් දරයි.

(2) මිනිසාගේ ස්නායු පද්ධතියේ කෘත්‍යමය ඒකකය නියුරෝනයයි.

(3) ප්‍රත්‍යානුවේගී ස්නායු පද්ධතිය පුද්ගලයෙකු හදිසි අවස්ථාවක් සඳහා සූදානම් කරයි.

(4) මිනිසාගේ චාලක නියුරෝනයක අක්‍රිය විභවය -40 mV පමණ වේ.

(5) අක්සනයක විශ්කම්භය වැඩි වන විට ආවේග සන්නයන වේගය වැඩි වේ.

122. නියුරෝනයක ක්‍රියා විභවය පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?

(1) එය අක්සන පටලයේ ධ්‍රැවීයතාවේ අනිත්‍ය ප්‍රතිවර්තනයකි.

(2) එය ඇති කිරීම සඳහා දේහලීය උත්තේජනයක් අවශ්‍යය. (3) එය ස්වයං ප්‍රචාරනය වේ.

(4) එහි විධ්‍රැවනය සිදුවනුයේ $Na^+$ ඇතුළට ගමන් කිරීම නිසාය.

(5) එය සම්පූර්ණ වීම සඳහා $Na^+K^+$ පොම්පය අත්‍යවශ්‍ය නොවේ.

123. මිනිසාගේ සමස්ථිතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?

(1) සමස්ථිතිය යනු නියත අභ්‍යන්තර පරිසරයක් පවත්වා ගැනීමයි.

(2) එය සෘණ ප්‍රතිපෝෂී යන්ත්‍රන හරහා සිදු වේ.

(3) රුධිර යූරියා මට්ටම සමස්ථිතික ලෙස යාමනයවේ.



Scanned with CamScanner

(4) සමස්ථියේ දී අක්මාව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
(5) සමස්ථිතික යන්ත්‍රණ ප්‍රධාන වශයෙන් අනිච්ඡානුගය.

124.මිනිස් මොළයේ කොටස් කිහිපයක් සහ ඒවායේ කෘත්‍යයන් පහත දී ඇත. එම "මොළයේ කොටස - කෘත්‍යය" සංකලන අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) හයිපොතැලමස - කුසගින්න යාමනය කිරීම.
(2) සුෂුම්නා ශීර්ෂකය - හෘත් ස්පන්දන වේගය යාමනය කිරීම.
(3) අනුමස්තිශ්කය - ඉරියව් යාමනය කිරීම. (4) ශංඛක ඛණ්ඩිකාව - කථනය යාමනය කිරීම.
(5) තැලමස - සංවේදී තොරතුරු සමාකලනය කිරීම.

125.මානව ක්ෂීරණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි වනුයේ කුමක් ද?
(1) ක්ෂීරණය යනු ක්ෂීර ග්‍රන්ථි වලින් කිරි නිපදවා නිදහස් කිරීමයි.
(2) කිරි පිටකිරීමේ ප්‍රතිකය සඳහා ඔක්සිටෝසින් දායක වේ.
(3) කිරි නිපදවීම ප්‍රොජෙස්ටරෝන් මගින් මැඩ පැවැත්වේ.
(4) කිරි නිපදවීම පවත්වා ගැනීම සඳහා ළදරුවා කිරි උරා බීම අත්‍යවශ්‍ය වේ.
(5) මානව කලල බන්ධ ලැක්ටෝජන් මගින් කිරි නිපදවීම වැඩි කෙරේ.

126.පුරුෂ ප්‍රජනක පද්ධතිය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක්ද?
(1) ඉන්හිබින් LH ස්‍රාවය වීම නිශේධනය කරයි.
(2) ශුක්‍රාණු ගබඩා කරනු ලබන ප්‍රධාන ස්ථානය ශුක්‍ර නාලය යි.
(3) ශුක්‍රාණු අධිසක්‍රියකරණය වනුයේ අපිවෘෂණයේ දී ය.
(4) ශුක්‍ර තරලයේ වැඩි ප්‍රමාණයක් නිපදවනුයේ පුරස්ථ ග්‍රන්ථිය මගිනි.
(5) ශුක්‍ර ආශයිකා ස්‍රාවය ප්‍රොස්ටග්ලැන්ඩින්වල පොහොසත් ප්‍රභවයකි.

127.මානව ප්‍රජනනය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ශුක්‍රාණු වල අග්‍රදේහ ප්‍රතික්‍රියාව අරීය මුකුටය පසාරු කිරීම සඳහා අවශ්‍ය වේ.
(2) ඩිම්බයේ බාහික ප්‍රතික්‍රියාව බහුශුක්‍රාණුප්‍රාප්තිය වලකයි.
(3) ඩිම්බ මෝචනයේ දී ග්‍රාෆීය ස්‍යූනිකාවෙන් ප්‍රාථමික අණ්ඩ සෛලයක් නිදහස් කෙරේ.
(4) ඩිම්බ මෝචනයෙන් පසු පැය 48ක් ඇතුළත සංසේචනය සිදුවිය යුතුය.
(5) අණ්ඩෝද්භවය යෞවනෝදයෙන් පසුව ආරම්භ වේ.

128.මිනිසාගේ කංකාල පද්ධතිය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද? / කුමන ඒවා ද?
(A) කපාලයේ පාර්ශ්වකපාල සහ ලලාට අස්ථි යන දෙක ම යුගලමය වේ.
(B) කශේරුවේ ග්‍රෛවී චක්‍රය උපතින් මාස 7-8 පමණ කාලයේ දී ඇති වේ.
(C) එය සමස්ථිතියේ දී කාර්යභාරයක් ඉටු කරයි. (D) පාදයේ අන්වායාම චක්‍ර දෙකක් ඇත.
(E) එය රතු රුධිරාණු සහ සුදු රුධිරාණු යන දෙවර්ගය ම නිපදවයි.

129.අස්ථි මත ක්‍රියා කරනුයේ මිනිසාගේ පහත සඳහන් කුමන හෝර්මෝනය ද? / හෝර්මෝනද?
(A) වර්ධක හෝර්මෝනය (B) එරිත්‍රොපොයිටින් (C) පැරාතෝමෝන්
(D) තයිරොක්සින් (E) ඇඩ්රිනලින්

132.සත්ත්වයන්ගේ ව්‍යූහ සමහරක් සහ එම ව්‍යූහ දරන සතුන්ට නිදසුන් පහත දක්වා ඇත. එම 'ව්‍යූහය - නිදසුන' සංකලන අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?
(1) විෂමදන්ති දත් - බළලා (2) සිළු සෛල - පටි පණුවා
(3) ස්නායු ජාලය - මුහුදු ඉකිරියා (4) ශ්වාසනාල - පත්තෑයා
(5) දැඩි කෙඳි - කුඩැල්ලා



Scanned with CamScanner

130.මිනිසාගේ චාලක නියුරෝනයක අක්‍රිය පටල විභවය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක්ද?

(1) එය ඇති වන්නේ අක්සන පටලය දෙපස අයන ව්‍යාප්තියේ වෙනස නිසාය.

(2) එය පවත්වා ගැනීම සඳහා සෝඩියම් පොටෑසියම් පොම්පයේ ක්‍රියාකාරිත්වය අවශ්‍ය ය.

(3) එය රැන්වියර් ගැටවල පිහිටයි. (4) එය -40 mV පමණ වේ.

(5) අක්සන පටලය උත්තේජනය කිරීම මගින් එය වෙනස් කළ හැකිය.

131.මිනිස් ආමාශය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වනුයේ කුමක් ද?

(1) එය ආහාරවල යාන්ත්‍රික හා රසායනික ජීර්ණය සඳහා සහභාගි වේ.

(2) ආමාශයික ග්‍රන්ථිවලට හානිවීම නිසා විටමින් $B_{12}$ අවශෝෂණය අඩු විය හැකි ය.

(3) ආමාශයික යුෂ ස්‍රාවය වීම සික්‍රටින් මගින් උත්තේජනය වේ.

(4) ආම්ලසය ආමාශයට ආපසු ගලා ඒම අලාර වක්‍රපිධානය මගින් වැළකේ.

(5) එය ආහාර මාර්ගයේ වඩාත් ම පළල් කොටසයි.

133.ආහාරයේ ඇති තන්තු පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?

(1) එය තුලිත ආහාරයක වැදගත් සංඝටකයකි. (2) එය මලබද්ධය වළකයි.

(3) එය සමහර ආමාශයාන්ත්‍රික ආබාධ වැළැක්වීමට උපකාරී වේ. (4) එය කෑම රුචිය අඩු කරයි.

(5) එය ක්‍රමාකුංචනය උත්තේජනය කරයි.

134.සමහර අවයවවල ඇති සිනිඳු පේශි සංකෝචනය කරන්නේත් තවත් සමහර අවයවවල ඇති සිනිඳු පේශි ඉහිල් කරන්නේත් පහත සඳහන් කුමන හෝර්මෝනය ද?

(1) ඔක්සිටෝසින් (2) ඇඩ්රිනලින් (3) ADH (4) තයිරොක්සින් (5) ටෙස්ටොස්ටෙරෝන්

135.මිනිසාගේ හෘත් පේශි තන්තුවක් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) එය දිගු සහ සිලින්ඩරාකාර වේ. (2) එය බහුන්‍යෂ්ටික ය. (3) එය සෙමින් විඩාවට පත්වේ.

(4) එය සාකොමියර කීපයක් දරයි. (5) එය දෛහික ස්නායු පද්ධතියෙන් ස්නායුත වේ.

136.මිනිසාගේ පෙනහැලි පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි වන්නේ කුමක් ද?

(1) දකුණු පෙනහැල්ල ඛණ්ඩිකා තුනක් දරන අතර වම් පෙනහැල්ල ඛණ්ඩිකා දෙකක් දරයි.

(2) විවේකීව සිටින විට උදම් පරිමාව ලීටර් 0.5ක් පමණ වේ.

(3) පෙනහැල්ලේ කෘත්‍යමය ඒකකය ගර්තයයි.

(4) ගර්තික බිත්තිය සනාකාර අපිච්ඡද සෛල තනි ස්තරයකින් තැනී ඇත.

(5) ගර්තික බිත්තිය සහ කේශනාලිකා බිත්තිය හරහා සිදුවන වායු හුවමාරුව සන්තතික ක්‍රියාවලියකි.

137.මිනිස් හෝර්මෝන පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/ කුමන ඒවාද?

(A) ටෙස්ටොස්ටෙරෝන් ස්‍රාවය කිරීම යාමනය කිරීමට GnRH වලට පුළුවන

(B) පීත දේහය සහ කලල බන්ධය යන දෙකෙන්ම ප්‍රොජෙස්ටෙරෝන් ස්‍රාවය වේ

(C) අග්න්‍යාශයේ බදරිකාවලට හානි සිදු වීම් නිසා මධුමේහය ඇති විය හැකිය.

(D) රුධිරයේ වර්ධක හෝර්මෝන මට්ටම යාමනය කිරීම සඳගා පෝෂී හෝර්මෝන දෙකක් දායක වේ.

(E) වෘක්කාණුවේදී අනිවාර්ය ලෙස ජලය ප්‍රතිශෝෂණය වීම ADH නිසා වැඩි වීමට පුළුවන

142.මිනිසාගේ ආහාර ජීරණය යාමනය පිළිබඳ නිවැරදි වන්නේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කුමක් ද?

(1) බේටය ස්‍රාවය වීම සික්‍රටීන් මගින් නිශේධනය වේ.

(2) ආමාශයික යුෂ ස්‍රාවය වීම ගැස්ට්‍රින් මගින් නිශේධනය වේ.

(3) පිත ග්‍රහණියට නිදහස් කිරීම CCK මගින් උත්තේජනය වේ.

(4) ආමාශයේ චලභාවය එන්ටෙරොකයිනේස් මගින් නිශේධනය වේ.

(5) අග්න්‍යාශයෙන් නිපදවන හෝර්මෝන මගින් ආමාශයික යුෂ ස්‍රාවය වීම උත්තේජනය වේ.



Scanned with CamScanner

143.මිනිසාගේ ශ්වසන යාමනය පිළිබඳ නිවැරදි වන්නේ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කුමක් ද?

(1) ව්‍යායාම කරන විටදී පෙනහැලි වාතනය වීම සඳහා ගෙලේ සහ පිටේ පේශි ද සහභාගි විය හැකිය.

(2) මහා ප්‍රාචීර පේශි සංකෝචනය වීමේ ප්‍රතිඵලයක් ලෙස එහි වක්‍රතාවය වැඩි වේ.

(3) ප්‍රශ්වාසයේදී පේශි සංකෝචනය හේතුවෙන් උරස් කුහරයේ පරිමාව වැඩි වේ.

(4) උරස් කුහරයේ පරිමාව වැඩිවීමේදී ප්ලූරා කුහරයේ පීඩනය වැඩි වේ.

(5) පෙනහැලි වාතන ක්‍රියාවලියේදී ආශ්වාසය හා ප්‍රශ්වාසය අනුයාත ලෙස අඛණ්ඩ ව සිදු වේ.

144.සත්ත්වයා හා බහිස්‍රාවී ව්‍යුහය වැරදි ලෙස සඳහන් කර ඇත්තේ පහත සඳහන් කුමන ප්‍රතිචාරයේ ද?

| | සත්වයා | බහිස්‍රාවී ව්‍යුහය | | සත්වයා | බහිස්‍රාවී ව්‍යුහය |
|---|---|---|---|---|---|
| (1) | ඉස්සා | හරිත ග්‍රන්ථි | (2) | කුරුමිණියා | මැල්පිගීය නාලිකා |
| (3) | මෝරා | වෘක්ක | (4) | කැස්බෑවා | ලවණ ග්‍රන්ථි |
| (5) | ගැඩවිලා | දේහාවරණය | | | |

145.මිනිසාගේ ස්නායු පද්ධතියේ ඇති වන රෝගාබාධයක් වන්නේ

(1) ඇඩිසන් රෝගයයි. (2) හන්ටින්ටන් රෝගයයි. (3) ආඝාතයයි.

(4) පෙලාග්‍රාවයි. (5) ලෙප්ටොස්පයිරෝසියාවයි.

146.මිනිස් දේහයේ ඇති සංවේදී ව්‍යුහ කිහිපයක් පහත දැක්වේ. උෂ්ණත්ව ප්‍රතිග්‍රාහක වන්නේ.

A - ක්‍රවුස් අන්ත බල්බ B - මර්කල් මඬල C - රෆිනි දේහාණු D - මයිස්නර් දේහාණු

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි.

(4) B හා C පමණි. (5) B හා D පමණි.

147.මිනිසාගේ ශුක්‍රාණුජනනය පිළිබඳ පහත දී ඇති ප්‍රකාශ අතරෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) ටෙස්ටොස්ටෙරෝන් ස්‍රාවය කිරීම සඳහා FSH මගින් ලේඩිග් සෛල උත්තේජනය කරනු ලබයි.

(2) GnRH මගින් ශුක්‍රාණුජනනය උත්තේජනය වේ.

(3) ප්‍රාක්ශුක්‍ර , ශුක්‍රාණු බවට විකසනය වීම උත්තේජනය වන්නේ ටෙස්ටොස්ටෙරෝන් මගිනි.

(4) ටෙස්ටොස්ටෙරෝන් ස්‍රාවය වීම වැඩි වූ විට හයිපොතැලමස මගින් GnRH ස්‍රාවය වීම වැඩි වේ.

(5) ශුක්‍රාණුජනනය අඩුවන විට සටෝලි සෛල මගින් ඉන්හිබින් ස්‍රාවය වීම උත්තේජනය වේ.

148.මිනිස් මොළයේ සංවේදී තොරතුරු සමාකලනය කරන මධ්‍යස්ථානය වන්නේ,

(1) තැලමස ය. (2) හයිපොතැලමස ය. (3) සිව්බිඩි දේහ ය.

(4) වැරෝලි සේතුව ය. (5) සුෂුම්නා ශීර්ෂකය ය.

149. රුධිර ගණ ගැලපීමක් නොමැති ව ඕනෑම ප්‍රතිග්‍රාහකයකුට රුධිරය පාරවිලයනය කළ හැකි දායකයකුගේ රුධිර ගණය වන්නේ

(1) $AB^+$ ය. (2) $AB^-$ ය. (3) $O^+$ ය. (4) $O^-$ ය. (5) $B^-$ය.

150. $Na^+$ $K^+$පොම්පය සක්‍රිය වනුයේ අක්සනයක ප්ලාස්ම පටලය,

(1) ධ්‍රැවණය වූ තත්ත්වයේ පවතින විට ය. (2) විධ්‍රැවණය වූ තත්ත්වයේ පවතින විට ය.

(3) විධ්‍රැවණය වූ අවස්ථාවේ සිට ප්‍රතිධ්‍රැවණ අවස්ථාවට පත්වන විට ය.

(4) ප්‍රතිධ්‍රැවණය වූ අවස්ථාවේ සිට උපරිධ්‍රැවණ අවස්ථාවට පත්වන විට ය.

(5) ධ්‍රැවණය වූ අවස්ථාවේ සිට විධ්‍රැවණ අවස්ථාවට පත්වන විට ය.

151.ජීවියෙකුගේ මූලික පරිවෘත්තීය වේගය මැනීමට සුදුසු දර්ශකයක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) පරිභෝජන ශීඝ්‍රතාව (2) නිදහස් කිරීමේ ශීඝ්‍රතාව

(3) ඒකක ක්ෂේත්‍රඵලයකින් පිටවන තාප ප්‍රමාණය (4) නිපදවන මූත්‍ර ප්‍රමාණය

(5) ආහාර ඔක්සිකරණය කිරීමේ ශීඝ්‍රතාව



Scanned with CamScanner

152.මානව උපත් පාලන ක්‍රම පිළිබඳ පහත සඳහන් කවර ප්‍රකාශයක් සත්‍ය වේ ද?
(1) උපත් පාලන ගිලින පෙති මගින් ඔසප් චක්‍රය තාවකාලික වන නවතී.
(2) පැලෝපීය නාළ ගැටගැසීම මගින් ඩිම්බ මෝචනය නවතී.
(3) IUD ලූපය නිසා ගැබ්ගෙල ශ්ලේෂ්මලකය ඝන වේ.
(4) වාසෙක්ටමි නිසා ශුක්‍රාණුජනනය නවතී. (5) Depo Provera නිසා ඩිම්බ මෝචනය නවතී.

153.සතුන්ගේ සැකිලි පද්ධති සම්බන්ධ ව පහත දී ඇති ප්‍රකාශ ඇතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ද්‍රවස්ථිති සැකිලි දක්නට ලැබෙන්නේ සීලෝමිකයන්ගේ පමණි.
(2) අස්ථිමය සැකිල්ල සැමවිට ම ජීවියෙකුගේ අභ්‍යන්තර සැකිල්ලක් ලෙස ක්‍රියා කරයි.
(3) කැල්සියම් කාබනේට්වලින් තැනුනු සැකිලි එක ම වංශයේ ජීවීන්ගේ පිටසැකිල්ලක් මෙන් ම අභ්‍යන්තර සැකිල්ලක් ලෙස ද දැකිය හැකි ය.
(4) මිනිසාගේ සැකිල්ල අස්ථිවලින් පමණක් සෑදී ඇත.
(5) සැකිලි කොටස් අතර ඇති චලනය කළ හැකි සන්ධි දක්නට ලැබෙනුයේ ඇතුලු සැකිලිවල පමණි.

## රචනා

01. (a) ප්ලාස්ම පටලයේ ව්‍යුහය විස්තර කරන්න.
(b) අක්සනයක ප්ලාස්ම පටලයේ ස්නායු ආවේගයක් ජනනය වන ආකාරය සහ එය මයලිනිභූත නොවන අක්සනයක් ඔස්සේ සන්නයනය වන ආකාරය පැහැදිලි කරන්න.

02. (a) ප්‍රෝටිස්ටාවන් අතර දක්නට ලැබෙන පෝෂණ විවිධත්වය කෙටියෙන් විස්තර කරන්න.
(b) මිනිස් ආමාශයේ දළ ව්‍යුහය විස්තර කරන්න.

03. (a) මිනිස් සමෙහි ව්‍යුහය කෙටියෙන් විස්තර කරන්න.
(b) මිනිස් සම උෂ්ණත්ව යාමනයෙහිලා ක්‍රියා කරන ආකාරය කෙටියෙන් පහදා දෙන්න.

04. (i) මිනිසාගේ ශ්වසන පද්ධතියේ දල ව්‍යුහය විස්තර කරන්න.
(ii) ශ්වශන වායු හුවමාරුව හා ශ්වශන වායු පරිවහනය විස්තර කරන්න.

04. (a) සමස්ථිතිය යනු කුමක් ද?
(b) මිනිසාගේ අග්න්‍යාසය හා වෘක්කය රුධිර ග්ලූකෝස් මට්ටම යාමනය කිරීමට උපකාර වනුයේ කෙසේදැයි කෙටියෙන් පහදා දෙන්න.

05. මානව ඔසප් චක්‍රය විස්තර කර හෝර්මෝන මගින් එය යාමනය කරනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

06. මිනිසාගේ රුධිර ග්ලූකෝස් මට්ටම යාමනය කෙරෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

07. මානව ශුක්‍රාණුවේ සහ ඩිම්බයේ ව්‍යුහ ඒවා ඉටු කරන කෘත්‍යයන්ට අදාලව විස්තර කරන්න.

08. (a) මිනිස් වෘක්කයේ දළ ව්‍යුහය විස්තර කරන්න.
(b) මිනිසාගේ මූත්‍රා සෑදීමේ ක්‍රියාවලිය සැකවින් විස්තර කරන්න.

09. මිනිසාගේ දේහය උෂ්ණත්වය යාමනය කෙරෙන්නේ කෙසේදැයි විස්තර කරන්න.

10. (a) මිනිස් වෘෂණවල පිහිටීම විස්තර කරන්න.
(b) මිනිස් වෘෂණවල ව්‍යුහය කෙටියෙන් විස්තර කරන්න.
(c) මිනිසාගේ ශුක්‍රාණුජනන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.



Scanned with CamScanner

11. (a) මිනිස් වෘක්කයේ පිහිටීම විස්තර කරන්න.
(b) ද්‍රර්ශීය මිනිස් වෘක්කාණුවක අණ්වීක්ෂීය ව්‍යුහය සැකෙවින් විස්තර කරන්න.
(c) මිනිස් වෘක්කය රුධිර ආස්‍රැති පීඩනය යාමනය කරන්නේ කෙසේදැයි සැකෙවින් පැහැදිලි කරන්න.

12. (a) මානව ඩිම්බකෝෂයේ ව්‍යුහය විස්තර කරන්න.
(b) ඔසප් චක්‍රයේ ඩිම්බකෝෂ ක්‍රියාවන් ප්‍රජනක හෝර්මෝන මගින් යාමනය කරනු ලබන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

13. කෙටි සටහන් ලියන්න.
1. මානව කලල අධිරෝපනය
2. මානව ඩිම්බ කෝෂය
3. සත්වයන්ගේ පිට සැකිල්ල
4. මිනිස් අග්න්‍යාශය
5. මිනිස් කශේරුව
6. මිනිසාගේ වසා පද්ධතිය
7. පේශි සංකෝචනයේ සර්පන සූත්‍රිකා වාදය
8. සතුන්ගේ පෝෂණ යාන්ත්‍රන

14. (i) මානව හෘදයේ ව්‍යුහය විස්තර කරන්න.
(ii) හෘදයේ සන්නයන පද්ධතිය හා හෘත් චක්‍රය විස්තර කරන්න.

15. කෙටිසටහන් ලියන්න.
1. සහජ ප්‍රතිශක්තිය
2. පරිචිත ප්‍රතිශක්තිය
3. ප්‍රතිශක්ති ඌනතා රෝග

16. හයිපොතැලමස හා පිටියුටරිය මඟින් සිදුකරන හෝමෝනමය ක්‍රියාකාරිත්වය විස්තර කරන්න.

17. (i) මිනිසාගේ රුධිර ග්ලූකෝස් මට්ටම සමස්ථිතිකව යාමනය වන ආකාරය විස්තර කරන්න.
(ii) හෝමෝන උදාහරණයක් ලෙස ගනිමින් ධන ප්‍රතිපෝෂණය හා සෘණ ප්‍රතිපෝෂණය පැහැදිලි කරන්න.

18. (i) මිනිසාගේ ශුක්‍රාණුවේ හා අන්ඩයේ ව්‍යුහ කෘත්‍යයට සම්බන්ධ කරමින් විස්තර කරන්න.
(ii) මිනිසාගේ අන්ඩ ජනන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

## ව්‍යුහගත රචනා

01. (A) (i) සීලෙන්ටරේටාවන් සහ පැතලි පණුවන් හැර, අසම්පූර්ණ ආහාර මාර්ගයක් දරන සතුන් ඇතුළත් වර්ගයක් නම් කරන්න. (රුල් 1)
(ii) (a) රේත්‍රිකාව යනු කුමක් ද? (රුල් 2)
(b) රේත්‍රිකාවේ ප්‍රයෝජනය කුමක් ද? (රුල් 1)
(iii) (a) සමහර ශාක කෘමිභක්ෂක වන්නේ ඇයි? (රුල් 1)
(b) කෘමිභක්ෂක ජලජ ශාකයක ගණ නාමය සඳහන් කරන්න. (රුල් 1)
(iv) (a) බාහිරයේ සිට මිනිසාගේ ගර්ත දක්වා වාතය ගමන් ගන්නා මාර්ගය නිවැරදි අනුපිළිවෙළින් ලියන්න. (රුල් 2)
(b) මිනිස් ශ්වසන මාර්ගයේ ඇති කලස් සෛලවල කෘත්‍යය කුමක් ද? (රුල් 1)
(v) (a) ශ්වසන චක්‍රය යනු කුමක් ද? (රුල් 2)
(b) විවේකීව සිටින විට නිරෝගී පරිණත මිනිසෙකුගේ එක් සාමාන්‍ය ශ්වසන චක්‍රයකදී ශ්වසන පද්ධතියට ඇතුළු වන වාත පරිමාව කොපමණ ද? (රුල් 1)
(B) (i) (a) මුත්‍ර සෑදීමේදී සිදුවන අතිපරිශ්‍රාවණය යනුවෙන් අදහස් කෙරෙනුයේ කුමක් ද? (රුල් 2)
(b) මිනිස් වෘක්කාණුවේ කුහරය තුළට ස්‍රාවය කරනු ලබන අයනයක් නම් කරන්න. (රුල් 1)
(ii) මුත්‍ර සෑදීමට අමතර ව මිනිස් වෘක්කයේ කෘත්‍යයන් තුනක් සඳහන් කරන්න. (රුල් 3)
(iii) මිනිසාගේ තාපයාමනය සඳහා දායක වන හමේ ප්‍රතිග්‍රාහක නම් කරන්න. (රුල් 3)
(iv) (a) මිනිස් අක්මාවේ කෘත්‍යමය ඒකකය කුමක් ද? (රුල් 1)
(b) මිනිස් අක්මාවේ සමස්ථිතික කෘත්‍යයන් හතරක් සඳහන් කරන්න. (රුල් 4)
(v) (a) නියුරෝනවල අක්‍රිය පටල විභවය සඳහා දායක වන සාධක තුන මොනවා ද? (රුල් 3)



Scanned with CamScanner

(b) කථනය සඳහා අවශ්‍ය පේශිවල චලනය පාලනය කරනු ලබන්නේ මිනිස් මස්තිෂ්කයේ කුමන බණ්ඩිකාව මඟින් ද? (රුල් 1)

(C) (i) (a) හෝර්මෝනයක් යනු කුමක් ද? (රුල් 3)

(b) ADH ක්‍රියා කරන්නේ මිනිසාගේ වෘක්ක නාලිකාවල කොතැන්හි ද? (රුල් 1)

(ii) ස්නායුක සමායෝජනය සහ අන්තරාසර්ගී සමායෝජනය අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (රුල් 2)

(iii) (a) මිනිස් සැකිල්ලේ සමහර අස්ථි තුළ පිහිටන කෝටරක යනුවෙන් හැඳින්වෙන්නේ මොනවා දැයි කෙටියෙන් විස්තර කරන්න. (රුල් 2)

(b) මිනිස් කපාලය තැනීම සඳහා දායක නො වන කෝටරක සහිත අස්ථියක් නම් කරන්න. (1)

(iv) කෝටරකවල කෘත්‍ය දෙකක් සඳහන් කරන්න. (රුල් 2)

(v) මිනිස් අධෝහනුවේ දක්නට ලැබෙන ප්‍රසර දෙක නම් කර ඒ එක එකෙහි කෘත්‍යය සඳහන්කරන්න.(2)

02. (A) (i) මිනිස් හෘදයේ ගතිකරය පිහිටන ස්ථානය සඳහන් කරන්න. (රුල් 1)

(ii) මහා ධමනියෙන් ප්‍රථමයෙන්ම පැන නගින ධමනි නම් කර ඒවායින් රුධිරය සැපයෙන්නේ කුමන ව්‍යුහයට ද යන්න සඳහන් කරන්න. (රුල් 1)

(iii) මිනිසාගේ නියත දේහ උෂ්ණත්වයක් පවත්වා ගැනීම සඳහා රුධිර සංසරණ පද්ධතිය දායක වන්නේ කෙසේදැයි සඳහන් කරන්න. (රුල් 4)

(iv) ABO රුධිර ගණ සහ Rh සාධකය සලකමින් පහත සඳහන් පුද්ගලයින්ගේ රුධිර ගණ සඳහන් කරන්න. සාර්ව දායකයා (රුල් 1) සාර්ව ප්‍රතිග්‍රාහකයා (රුල් 1)

03. (A) (i) (a) කලල බන්ධය යනු කුමක් ද? (රුල් 3)

(b) මානවයින්ගේ දක්නට ලැබෙන කලලබන්ධ ආකාරය කුමක් ද? (රුල් 1)

(ii) (a) කලල බන්ධය හරහා මවගේ සිට භ්‍රෑණයටත් භ්‍රෑණයේ සිට මවටත් ගමන් කරන ද්‍රව්‍යයක් නම් කරන්න. (රුල් 1)

(b) කලල බන්ධය හරහා මවගෙන් භ්‍රෑණයට ගමන් කළ හැකි වයිරසයක් නම් කරන්න.(රුල් 1)

(iii) (a) මානව කලලබන්ධයෙන් පමණක් ස්‍රාවය වන හෝර්මෝනයක් නම් කරන්න. (රුල් 1)

(b) මව සහ භ්‍රෑණය අතර ද්‍රව්‍ය හුවමාරු කිරීම සහ හෝර්මෝන ස්‍රාවය කිරීම හැර කලල බන්ධය මගින් ඉටු කරනු ලබන කෘත්‍යයන් දෙකක් සඳහන් කරන්න. (රුල් 2)

(iv) (a) ක්ෂීරණය යනු කුමක් ද? (රුල් 1)

(b) ක්ෂීරණයට කෙලින් ම දායක වන හෝර්මෝන දෙකක් නම් කරන්න. (රුල් 1)

(v) ආර්තවහරණයට හේතුව කුමක් ද? (රුල් 1)

04. (A) (i) ආලෝක අණ්වීක්ෂයක අවබලය යටතේ නිරීක්ෂණය කළ විට මිනිස් මහාන්ත්‍රයේ හරස් කඩක දක්නට ලැබෙන, මිනිස් ක්ෂුද්‍රාන්ත්‍රයේ හරස් කඩකින් එය වෙන් කර හඳුනා ගැනීමට භාවිත කළ හැකි ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (රුල් 3)

(ii) ආමාශයික යුෂයේ HCl වල ප්‍රධාන කෘත්‍ය දෙකක් සඳහන් කරන්න. (රුල් 2)

(iii) මිනිස් වෘක්කයේ දී අයනවල වරණීය ප්‍රතිශෝෂණය සඳහා බලපාන හෝර්මෝන තුනක් නම් කරන්න.

(iv) (a) මිනිස් වෘක්කාණුවේ දී ප්‍රතිශෝෂණය කරනු ලබන මෙන්ම ස්‍රාවය කරනු ලබන අයනයක් නම් කරන්න.

(b) මිනිස් වෘක්කාණුවේ දී සක්‍රිය මෙන්ම නිෂ්ක්‍රිය යන්ත්‍රණ මඟින් ප්‍රතිශෝෂණය කරනු ලබන අයනයක් නම් කරන්න. (රුල් 1)

(රුල් 1)

(v) වෘක්ක ගල් වල ප්‍රධාන සංඝටක කුමක් ද? (රුල් 1)

(B) (i) (a) ස්නායු පද්ධතියේ සමස්ත කෘත්‍යය කුමක් ද?

(b) අක්සන වල ලක්ෂණ වලින් වෙනස් වන, අනුශාඛිකාවල ලක්ෂණ තුනක් සඳහන් කරන්න.(3)

(ii) (a) ස්නායු ආවේගයක් යනු කුමක් ද? (රුල් 1)

(b) අක්සනයක් ඔස්සේ ස්නායු ආවේගයක් සන්නයනය වන වේගය සඳහා බලපාන සාධක දෙකක් සඳහන් කරන්න. (රුල් 2)



Scanned with CamScanner

(iii) (a) මිනිස් හයිපොතැලමස මගින් ස්‍රාවය කරනු ලබන නිෂේධක හෝර්මෝන දෙකක් නම් කරන්න. (රූල් 1)

(b) හෝර්මෝන ස්‍රාවය කිරීමට අමතරව මිනිස් හයිපොතැලමස මගින් සිදු කරනු ලබන කෘත්‍ය මොනවාද? (රූල් 1)

(iv) ශ්‍රවණ සංවේදී ප්‍රදේශය පිහිටනුයේ මිනිස් මස්තිෂ්කයේ කුමන බණ්ඩිකාවේ ද? (රූල් 2)

(v) (a) පෝෂී හෝර්මෝනයක් යනු කුමක් ද?

(b) ආමාශයික යුෂ ස්‍රාවය කිරීම උත්තේජනය සිදු කරනු ලබන හෝර්මෝනය නම් කරන්න. (1)

(C) (i) (a) මිනිස් රුධිර සංසරන පද්ධතියේ සමස්ත කෘත්‍යය කුමක් ද? (රූල් 1)

(b) මිනිසාගේ වඩාත්ම බහුල ප්ලාස්ම ප්‍රෝටීනය කුමක් ද? (රූල් 1)

(ii) (a) හෘත් චක්‍රය යන්නෙන් අදහස් කෙරෙනුයේ කුමක් ද? (රූල් 2)

(b) මිනිසුන්ගේ රුධිර පීඩනය සාමාන්‍ය පරාසය තුළ පවත්වා ගැනීමට දායක වන සාධක තුනක් සඳහන් කරන්න. (රූල් 3)

(iii) රුධිර සංසරණ පද්ධතියක් නොමැති ත්‍රිප්‍රස්තර සතුන් අයත් වන වංශයක් නම් කරන්න.(රූල් 1)

(iv) (a) ද්‍රාව්‍ය, ජලයේ ද්‍රවණය වන විට ජල විභවයට කුමක් සිදු වේ ද? (රූල් 1)

(b) ශූනතා පීඩනය යනු කුමක් ද? (රූල් 2)

(v) (a) විශූනතාව යනු කුමක් ද? (රූල් 2)

(b) ආරම්භක විශූනතාවේ දී ශාක සෛලයක පීඩන විභවය කොපමණ ද? (රූල් 1)

(c) ශාක සෛලයක ආරම්භක විශූනතාවේ දී ජල විභවය, ද්‍රාව්‍ය විභවයට වඩා වැඩි ද අඩු ද එසේත් නැත්නම් සමාන ද යන්න සඳහන් කරන්න. (රූල් 1)

05. (A) (i) (a) මිනිස් රුධිරයේ කාබන් ඩයොක්සයිඩ් වැඩි ම ප්‍රමාණයක් පරිවහනය කරනු ලබන ආකාර දෙක සඳහන් කරන්න. (රූල් 2)

(b) ශ්වසන පාලක මධ්‍යස්ථානය පිහිටනුයේ මිනිස් මොළයේ කොතැන්හි ද? (රූල් 1)

(ii) සංචරණය යනු කුමක් ද? (රූල් 1)

(iii) (a) පේශි තන්තු වර්ග තුනට ම පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (රූල් 2)

(b) හෘත් සහ සිනිඳු පේශි තන්තු වල නොමැති, කංකාල පේශි තන්තු සතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (රූල් 2)

(iv) (a) පුළුල් පරාසයක චලනය කිරීමේ හැකියාව මිනිස් උඩු බාහුවට ලැබී ඇත්තේ කුමන ව්‍යුහාත්මක සැකැස්ම මගින් ද? (රූල් 2)

(b) මිනිස් පූර්ව ගාත්‍රයේ දක්නට ලැබෙන, බර එසවීමේ දී උපකාරී වන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(c) මිනිස් අපර ගාත්‍රයේ දක්නට ලැබෙන, සෘජු ඉරියව්වට දායක වන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(v) දුවස්ථිති සැකිල්ලේ අවාසියක් සඳහන් කරන්න. (රූල් 1)

(C) (i) (a) මිනිස් ශුක්‍රාණුවේ සහ මිනිස් ඩිම්බයේ ආයු කාලයන් කොපමණ ද? (රූල් 1)

(b) මිනිස් ශුක්‍රාණුජනනයේ දී සහ අණ්ඩෝද්භවයේ දී දෙවැනි ඌනන විභාජනය සිදු වන්නේ කුමන අවස්ථාවේදීද? (රූල් 2)

(ii) (a) මිනිස් ශුක්‍රාණුජනනයේ දී ඉන්හිබින්වල කාර්යභාරය කුමක් ද? (රූල් 1)

(b) ශුක්‍රාණුවක අග්‍රදේහ ප්‍රතික්‍රියාව යනු කුමක් ද? (රූල් 2)

(iii) (a) ඩිම්බ මෝචනය යනු කුමක් ද? (රූල් 1)

(b) ඩිම්බ මෝචනය ක්‍රියාරම්භ කරනුයේ කුමන හෝර්මෝනය ද? (රූල් 1)

(iv) මිනිස් ඩිම්බයේ ශුක්‍රාණු ප්‍රතිග්‍රාහක පිහිටියේ කොතැන්හි ද? (රූල් 1)

(v) (a) ඊස්ට්‍රජන්වල කෘත්‍ය දෙකක් සඳහන් කරන්න. (රූල් 2)

(b) මිනිස් කලල බන්ධයෙන් ස්‍රාවය වන, මයෝමෙට්‍රියමේ සංකෝචන මැඩ පවත්වන හෝර්මෝනයක් නම් කරන්න. (රූල් 1)

(c) දරු ප්‍රසූතියේ දී ඔක්සිටෝසින්වල කාර්යභාරය කුමක් ද? (රූල් 2)



Scanned with CamScanner

06. (A) (i) සමස්ථිතිය යනු කුමක් ද? (රුල් 2)

(ii) මිනිසාගේ සමස්ථිතික ලෙස යාමනය වන සාධක තුනක් සඳහන් කරන්න. (රුල් 3)

(iii) මිනිසාගේ සමස්ථිතියේ වාසි දෙකක් සඳහන් කරන්න. (රුල් 2)

(iv) මිනිසාගේ සමස්ථිතියේ එක් අවාසියක් සඳහන් කරන්න. (රුල් 1)

(v) මානව අක්මාව සමස්ථිතියේදී කාර්යභාරයන් රැසක් ඉටු කරයි. එවැනි කාර්යභාරයන් හතරක් සඳහන් කරන්න. (රුල් 4)

(vi) මිනිසා තුළ ක්‍රියාත්මක වන ධන ප්‍රතිපෝෂී යන්ත්‍රණ සඳහා නිදසුන් දෙකක් දෙන්න. (රුල් 2)

(B) (i) ක්ෂීරණය යනු කුමක්ද? (රුල් 2)

(ii) මානව කිරිවල වඩාත්ම බහුල සංඝටකය කුමක් ද? (රුල් 1)

(iii) පියයුරු මත ක්‍රියා කරන කලලබන්ධ හෝර්මෝන දෙකක් නම් කරන්න. (රුල් 1)

(iv) කොලස්ට්‍රම්වල සංඝටක දෙකක් නම් කරන්න. (රුල් 1)

(v) ක්ෂීරණයේ දී ඔක්සිටොසින්වල කාර්යභාරය කුමක් ද? (රුල් 2)

(vi) ස්ත්‍රීන්ගේ කිරි නිපදවීම නිශේධනය කරන හෝර්මෝන දෙකක් නම් කරන්න. (රුල් 1)

(vii) මව්කිරි දීමේ වාසි තුනක් සඳහන් කරන්න. (රුල් 3)

(C) (i) මානව ස්නායු පද්ධතියේ ප්‍රධාන කෘත්‍ය තුන සඳහන් කරන්න. (රුල් 3)

(ii) ද්විත්ව උදරීය ස්නායු රජ්ජු දරන සතුන් සහිත වංශ දෙකක් නම් කරන්න. (රුල් 1)

(iii) අරීය ස්නායු දරන සතුන් සහිත වංශයක් නම් කරන්න. (රුල් 1)

(iv) අන්තරාසර්ග යාමනයට වඩා ස්නායු යාමනයේ ඇති වාසි දෙකක් සඳහන් කරන්න. (රුල් 2)

(v) ප්‍රතිග්‍රාහකයක් යනු කුමක් ද? (රුල් 2)

(vi) ප්‍රතිග්‍රාහකවල ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (රුල් 3)

(vii) ස්පර්ශයට සංවේදී ප්‍රතිග්‍රාහක තුනක් නම් කරන්න. (රුල් 3)

07. (A) (i) පහත සඳහන් ජීවීන්ගේ දක්නට ලැබෙන අලිංගික ප්‍රජනන ආකාර සඳහන් කරන්න.

(a) *Paramecium* (b) *Plasodium* (c) *Hydra* (d) *Spirogyra* (e) *Agaricus*

(ii) අලිංගික ප්‍රජනනයේ වාසි සඳහන් කරන්න.

(iii) මිනිසාගේ ශුක්‍රාණුජනනයේදී දැකිය හැකි ද්විගුණ සහ ඒකගුණ සෛල නිවැරදි තීරුවේ ලියන්න.

(iv) මිනිසාගේ ශුක්‍රාණුජනනය සඳහා දායකවන හෝර්මෝන නම් කර, ඒ එක එකක් ස්‍රාවය කරනු ලබන අන්තරාසර්ග ග්‍රන්ථි සඳහන් කරන්නන.

(B) (i) ආර්තවහරණය යනු කුමක් ද?

(ii) නිරෝගී සාමාන්‍ය ස්ත්‍රීන්ගේ ආර්තවහරණය සිදුවන වයස් සඳහන් කරන්න.

(iii) ආර්තවහරණයට හේතුව කුමක් ද?

(iv) ආර්තවහරණය හා සම්බන්ධ කංකාල පද්ධතියේ ආබාධය කුමක් ද?

08. (A) (i) සිට A (iv) දක්වා වූ ප්‍රශ්න පහත දී ඇති රූප සටහන මත පදනම් වේ

(i) ඉහත රූප සටහනේ දැක්වෙන ව්‍යුහය කුමක් ද? (රුල් 1)

(ii) ඉහත රූප සටහනේ a - d ලෙස සලකුණු කර ඇති ව්‍යුහ නම් කරන්න. (රුල් 2)




(iii) ඉහත රූප සටහනේ දක්වා ඇති ව්‍යුහයේ දක්නට ලැබෙන ප්‍රධාන සෛල වර්ග දෙක නම් කර, ඒ එක එකෙහි ප්‍රධාන කෘත්‍යය සඳහන් කරන්න. (රුල් 2)

(iv) a තුළ ඇති ව්‍යුහ මොනවා ද?

(B) (i) මිනිසාගේ රන්ධ්‍රයක් ලෙස හැඳින්වෙනුයේ කුමක් ද?

(ii) මිනිසාගේ දක්නට ලැබෙන ප්‍රධාන රන්ධ්‍ර නම් කරන්න.

(iii) රන්ධ්‍රවල ප්‍රධාන කෘත්‍යයන් සඳහන් කරන්න.

(iv) කපාලයේ කෝටරක ලෙස හැඳින්වෙනුයේ මොනවාද?

(v) කෝටරක නොමැති කපාල අස්ථි නම් කරන්න.



Scanned with CamScanner

(රෑල් 1)

09 (A) i. a. පෝෂණය යනු කුමක් ද? (රෑල් 2)

b. ස්වයංපෝෂීන් සහ විෂම පෝෂීන් අතර ඇති ප්‍රධාන වෙනස කුමක් ද? (රෑල් 2)

ii. a. සහබෝජිත්වය යනු කුමක් ද? (රෑල් 2)

b. සහබෝජිත්වය අන්‍යොන්‍යාධාරයෙන් වෙනස් වන්නේ කෙසේ ද?

iii. a. මිනිස් ආහාරයේ ඇති තන්තුවල කෘත්‍ය දෙකක් සඳහන් කරන්න.

b. විටමින යනු මොනවා ද?

c. මිනිසාගේ පහත සඳහන් එක් එක් ආබාධයට හේතු වන්නේ කුමන විටමිනයේ ඌනතාව ද?

1. අන්ධභාවය 2. මුඛය වටා ඇති සම පැලීම

(රෑල් 2)

iv. a. ක්‍රමාකුංචනය යනු කුමක් ද? (රෑල් 2)

b. මිනිස් ආහාර මාර්ගයේ අවුර්බාක් ප්‍රතානය පිහිටන ස්ථානය සඳහන් කරන්න. (රෑල් 2)

v. a. එන්ටෙරොගැස්ට්‍රෝනවල කෘත්‍ය දෙකක් සඳහන් කරන්න.

b. මිනිස් අංගුලිකාවල ඇති ආන්ත්‍ර සෛලවල පමණක් දැකිය හැකි ජීර්ණ එන්සයිම දෙකක් නම් කරන්න.

(රෑල් 2)

(B) i. බහිස්‍රාවය යනු කුමක් ද?

ii. රුධිර වාහිනී සමඟ කිට්ටු සම්බන්ධතාවක් දක්වන අපෘෂ්ඨවංශී බහිස්‍රාවී ව්‍යුහයක් නම් කරන්න.

(රෑල් 1)

iii. a. මානව වෘක්කාණු වර්ග දෙක නම් කරන්න

b. මානව වෘක්කාණුයේ අවිදූර සංවලිත නාලිකාව තුළට ඇතුළු වීම සඳහා ගුච්ඡිකාවේ සිට තරලය ගමන් කල යුත්තේ කුමන සෛල ස්ථර හරහා ද? (රෑල් 1)

iv. a. මානව වෘක්කාණුව තුළට ස්‍රාවය කරනු ලබන බහිස්‍රාවී ඵලයක් නම් කරන්න. (රෑල් 1)

b. මාන වෘක්කාණුව තුළට අක්‍රිය ලෙස ප්‍රතිශෝෂණය කරනු ලබන අයන දෙකක් නම් කරන්න.

v. මානව වෘක්කාණුවේ අනිවාර්ය ජල ප්‍රතිශෝෂණය සිදුවන ස්ථානය කුමක් ද? (රෑල් 1)

(C) i. a. මිනිසාගේ වාතාශ්‍රයේ ප්‍රධාන කෘත්‍යය කුමක් ද? (රෑල් 2)

b. විවේකීව සිටින මිනිසෙකුගේ සාමාන්‍ය හුස්ම ගැනීමකදී භාවිත කරන ප්‍රධාන පේශී මොනවාද?

ii. a. විවේකීව සිටින නිරෝගී වැඩිහිටි මිනිසෙකුගේ සාමාන්‍ය ශ්වසන සීඝ්‍රතාවය කුමක් ද? (1)

b. මිනිස් නාසයේ ශ්වසන කෘත්‍යය තුනක් සඳහන් කරන්න.

iii. a. මිනිසාගේ හුස්ම ගැනීම පාලනය කරන ප්‍රධාන සාධකය කුමක් ද? (රෑල් 1)

b. ඕනෑම ශ්වසන වර්ණකයක තිබිය යුතු අත්‍යාවශ්‍ය ලක්ෂණය කුමක් ද? (රෑල් 2)

iv. a. මානව ශ්වසන මාර්ගයේ ඇති ශ්ලේෂ්මලයේ කෘත්‍යය දෙකක් සඳහන් කරන්න.

b. මානව ගර්තයක් ආස්තරණය කරනු ලබන සෛල මොනවා ද? (රෑල් 1)

v. සත්වයෙකුගේ දේහයේ විශාලත්වයත් ශ්වසන පෘෂ්ඨයේ වර්ගඵලයත් අතර ඇති සම්බන්ධතාව කුමක් ද?

10. (A) (i) හිමොග්ලොබින් වලට අමතරව ගසතුන් තුළ දැකිය හැකි යකඩ අඩංගු ශ්වසන වර්ණක දෙක නම් කරන්න.

(ii) නිරෝගී වැඩිහිටි සාමාන්‍ය පුරුෂයකුගේ රුධිරයේ හිමොග්ලොබින් සාන්ද්‍රණය කුමක් ද?

(iii) මිනිසාගේ රුධිර සංඝටක තැනීමට අවශ්‍ය විටමින හතරක් නම් කරන්න.

(B) (i) වසා යනු කුමක් ද? (ii) මිනිසාගේ වසා පද්ධතියේ ප්‍රධාන වාහිනී දෙක නම් කරන්න.

(iii) මිනිසාගේ වසා පද්ධතිය රුධිර සංසරණ පද්ධතිය සමඟ සම්බන්ධ වන්නේ කොතැන්හිදී ද?

(iv) (a) මිනිසාගේ වසා වාහිනී සහ ශිරා අතර ඇති කැපී පෙනෙන ව්‍යුහාත්මක සමානතාව සඳහන් කරන්න.

(b) මිනිසාගේ රුධිර වාහිනී පද්ධතිය සහ වසා පද්ධතිය අතර ඇති ප්‍රධාන ව්‍යුහාත්මක වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(v) මිනිසාගේ වසා වාහිනී තුළ වසා පරිවහනය කරනු ලබන්නේ කෙසේද?

(C) (i) සහජ ප්‍රතිශක්තියේ අභ්‍යන්තර ආරක්ෂන යාන්ත්‍රන වලට අයත් ඒවා නම් කරන්න.

(ii) T වසා සෛල හා B වසා සෛල යනු මොනවා ද?

(iii) පහත පද හඳුන්වන්න.

(a) ප්‍රතිදේහ ජනක (b) එපිටෝප්පය (c) ප්‍රතිදේහ

(iv) පරිචිත ප්‍රතිශක්තියේ දී T හා B වසා සෛල වල කාර්ය භාරය කුමක් ද?

(v) කෘත්‍රිම සක්‍රිය පරිචිත ප්‍රතිශක්තිය යනු කුමක් ද?



Scanned with CamScanner